# මූලික පිරිවෙන් අවසාන විභාගය

# ඇගයීම් වාර්තාව

# 02-පාලි

# 2019

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂය මාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක හෝ අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවේණාචාර්යවරුන් ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පළමු වරට මූලික පිරිවෙන් අවසාන විභාගය 2019 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තා ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරුභවතුන්ට, පරිවේණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගයට අදාළ පාලි විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පිරිවෙන් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු, I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා එම ප්‍රශ්නවල හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. පිරිවෙන් විභාගයේ පාලි විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සංස්කරණ හා සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

2022.11.18

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එල්.එම්.ඩී.ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක වන මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ජාතික අධ්‍යාපනයේ කේන්ද්‍රය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි ඝනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සාම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට 1981 පවත්වන ලදී. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 135ක් විභාගය අසමත් විය.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂයෙකු අනිවාර්ය විෂයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් 02ක්වත් තෝරා ගත යුතුය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතුය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌණ සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌණ සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළමුවරට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා, පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරීන් ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එල්.එම්.ඩී. ධර්මසේන<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඩී.ඩී.වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - ආයතනික විභාග) |
| විෂය සම්බන්ධීකරණය | : | ඒ.කේ.එස්.අයි.කේ. ලියනගේ<br>විභාග කොමසාරිස්<br>(රහස්‍ය පාසල් විභාග ශාඛාව) |
| සංස්කරණය | : | ඩී.එම්.එස්. දිසානායක මයා<br>පරිවෙණාචාර්ය<br>අ/ ශ්‍රී විද්‍යාධාර මහා පිරිවෙන, කලාකරඹෑව |
| ලේඛක මණ්ඩලය | : | පූජ්‍ය නෙල්ලිගස්හින්නේ පියනන්ද හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>ශ්‍රී ජිනජෝතිකාරාම පුරාණ විහාරය,<br>කිරිඹරුව, කන්දේගෙදර<br><br>පූජ්‍ය සේදවත්තේ පඤ්ඤාවංස හිමි<br>විශ්‍රාමික පිරිවෙන් ගුරු<br>සුසීමාරාමය, රිලාවල, පොල්ගස්ඕවිට<br><br>ඩී.එම්.එස්. දිසානායක මයා<br>පරිවෙණාචාර්ය<br>අ/ ශ්‍රී විද්‍යාධාර මහා පිරිවෙන, කලාකරඹෑව |
| පරිගණක පිටපත සැකසුම | : | එම්.ඒ. චතුරිකා මධුමාලි<br>දත්ත සටහන් සහකාර |
| පිටකවරය නිර්මාණය | : | ආර්.එම්.එන්.ශෙහාන් යසරත්න<br>දත්ත සටහන් සහකාර |

# පටුන

පිටු අංකය


I කොටස

1 විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු 1

1.1 පාලි විෂය අධ්‍යයනයේ අරමුණු 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු 2

1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 2

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය 5

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

II කොටස

2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු 8

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු 8

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 8

2.1.2 I ප්‍රශ්න පත්‍රය 9

2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 17

2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - තේමා අනුව 18

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශතයක් ලෙස 20

2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු 22

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 22

2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 23

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 42

III කොටස

3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා 43

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 43

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා 44

## I කොටස

## 1 විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 පාලි විෂය අධ්‍යයනයේ අරමුණු

1. පාලි භාෂාව නිවැරදි ව උච්චාරණය කිරීමේ හා ලිවීමේ හැකියාව ඇති කිරීම.
2. පාලි භාෂාවේ අක්ෂර වින්‍යාසය, විවිධ පද, විවිධ වාක්‍ය රටා හා රචනය හුරු කිරීම.
3. පාලි ගද්‍ය පද්‍ය පාඨ මාතෘ භාෂාවටත් මාතෘ භාෂාවෙන් පාලි භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව ඇති කිරීම.
4. පාලි සාහිත්‍යය පිළිබඳ අවබෝධයක් ලබා දීම හා එහි එන ජීවන දර්ශනය උපයෝගී කර ගනිමින් පෞරුෂේය චරිතයක් බිහි කිරීම.
5. ත්‍රිපිටකාගත හරධර්ම චරිතායනය කෙරෙන ආදර්ශවත් හා මනා පෞරුෂයක් සහිත භික්ෂු පරපුරක් රටට දායාද කිරීම.
6. පාලි භාෂාව පිළිබඳ දැනුම සිංහල භාෂා ඥානයේ ප්‍රවීණත්වය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් බව තහවුරු කිරීම.
7. පාලි භාෂාව තමන්ගේ මෙන් ම ජාතියේ ද සිය රටේ ද උරුමයක් බව තහවුරු කිරීම.
8. ත්‍රිපිටකය හැදෑරීම සඳහා පාලි භාෂාව මූලික අවශ්‍යතාවක් බව අවධාරණය කිරීම.
9. ත්‍රිපිටකය හා අටුවා පරිශීලනය කරමින් ධර්මය නිවැරදි ව අර්ථකථනය කරන භික්ෂු පිරිසක් ශාසනයට දායක කිරීම.
10. ත්‍රිපිටක බුද්ධ වචනය නිවැරදි ව ග්‍රහණය කිරීම පිණිස ඇති ඒකායන මාර්ගය පාලි භාෂාව ඉගෙනීම බව පසක් කිරීම.
11. ත්‍රිපිටක බුද්ධ වචනය ඉදිරියට පවත්වාගෙන යෑමට ප්‍රතිබල සම්පන්න පිරිසක් බිහි කිරීම.
12. මහාවිහාරීය භික්ෂු සම්ප්‍රදාය විසින් සුරක්ෂිත විශිෂ්ට ඥාන සම්භාරය නොනසා ආරක්ෂා කිරීම.
13. ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් පාලි භාෂාව භාවිත කිරීම සඳහා සිසුන් යොමු කිරීම.
14. පාලි භාෂාව ඉගෙනීමෙන් බෞද්ධ දර්ශනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම පහසු වීම නිසා තමන්ටත් සිව්පසය සපයන දායක පිරිසටත් මෙලොව පරලොව සුභසිද්ධිය ළඟා කර ගත හැකි බව තහවුරු කිරීම.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2166 | 26 | 2192 |
| ඉංග්‍රීසි | 12 | 0 | 12 |
| එකතුව | **2178** | **26** | **2204** |

**වගුව 1**

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 162 | 7.44 | - | - | 162 | 7.35 |
| B | 197 | 9.05 | 3 | 11.54 | 200 | 9.07 |
| C | 530 | 24.33 | 6 | 23.08 | 536 | 24.32 |
| S | 935 | 42.93 | 9 | 34.61 | 944 | 42.83 |
| W | 354 | 16.25 | 8 | 30.77 | 362 | 16.43 |
| එකතුව | **2178** | **100.00** | **26** | **100.00** | **2204** | **100.00** |

**වගුව 2**

## 1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 148 | 23 | 15.54 | 18 | 12.16 | 38 | 25.68 | 54 | 36.49 | 133 | 89.86 | 15 | 10.14 |
| ගම්පහ | 194 | 18 | 9.28 | 22 | 11.34 | 57 | 29.38 | 82 | 42.27 | 179 | 92.27 | 15 | 7.73 |
| කළුතර | 129 | 9 | 6.98 | 14 | 10.85 | 34 | 26.36 | 57 | 44.19 | 114 | 88.37 | 15 | 11.63 |
| මහනුවර | 246 | 49 | 19.92 | 34 | 13.82 | 65 | 26.42 | 85 | 34.55 | 233 | 94.72 | 13 | 5.28 |
| මාතලේ | 72 | 6 | 8.33 | 4 | 5.56 | 13 | 18.06 | 36 | 50 | 59 | 81.94 | 13 | 18.06 |
| නුවරඑළිය | 32 | 2 | 6.25 | 8 | 25 | 14 | 43.75 | 7 | 21.88 | 31 | 96.88 | 1 | 3.13 |
| ගාල්ල | 177 | 3 | 1.69 | 7 | 3.95 | 33 | 18.64 | 86 | 48.59 | 129 | 72.88 | 48 | 27.12 |
| මාතර | 156 | 4 | 2.56 | 15 | 9.62 | 36 | 23.08 | 75 | 48.08 | 130 | 83.33 | 26 | 16.67 |
| හම්බන්තොට | 95 | 4 | 4.21 | 1 | 1.05 | 20 | 21.05 | 39 | 41.05 | 64 | 67.37 | 31 | 32.63 |
| වවුනියාව | 4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 50 | 2 | 50 | 2 | 50 |
| මඩකළපුව | 2 | 0 | 0 | 0 | 0 | 2 | 100 | 0 | 0 | 2 | 100 | 0 | 0 |
| අම්පාර | 56 | 5 | 8.93 | 18 | 32.14 | 22 | 39.29 | 8 | 14.29 | 53 | 94.64 | 3 | 5.36 |
| ත්‍රිකුණාමලය | 16 | 0 | 0 | 1 | 6.25 | 1 | 6.25 | 8 | 50 | 10 | 62.5 | 6 | 37.5 |
| කුරුණෑගල | 225 | 8 | 3.56 | 23 | 10.22 | 54 | 24 | 77 | 34.22 | 162 | 72 | 63 | 28 |
| පුත්තලම | 45 | 1 | 2.22 | 1 | 2.22 | 1 | 2.22 | 31 | 68.89 | 34 | 75.56 | 11 | 24.44 |
| අනුරාධපුර | 132 | 3 | 2.27 | 7 | 5.3 | 23 | 17.42 | 63 | 47.73 | 96 | 72.73 | 36 | 27.27 |
| පොළොන්නරුව | 39 | 1 | 2.56 | 1 | 2.56 | 12 | 30.77 | 22 | 56.41 | 36 | 92.31 | 3 | 7.69 |
| බදුල්ල | 119 | 1 | 0.84 | 7 | 5.88 | 28 | 23.53 | 57 | 47.9 | 93 | 78.15 | 26 | 21.85 |
| මොණරාගල | 66 | 2 | 3.03 | 1 | 1.52 | 23 | 34.85 | 34 | 51.52 | 60 | 90.91 | 6 | 9.09 |
| රත්නපුර | 131 | 14 | 10.69 | 13 | 9.92 | 28 | 21.37 | 66 | 50.38 | 121 | 92.37 | 10 | 7.63 |
| කෑගල්ල | 120 | 9 | 7.5 | 5 | 4.17 | 32 | 26.67 | 55 | 45.83 | 101 | 84.17 | 19 | 15.83 |
| **සමස්ත ප්‍රතිඵලය** | 2204 | 162 | 7.35 | **200** | **9.07** | **536** | **24.32** | **944** | **42.83** | **1842** | **83.58** | **362** | **16.42** |

**වගුව 3**

### 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 7 | 0.32 | 2204 | 100.00 |
| 81 - 90 | 34 | 1.54 | 2197 | 99.68 |
| 71 - 80 | 105 | 4.76 | 2163 | 98.14 |
| 61 - 70 | 193 | 8.76 | 2058 | 93.38 |
| 51 - 60 | 304 | 13.79 | 1865 | 84.62 |
| 41 - 50 | 476 | 21.60 | 1561 | 70.83 |
| **31 - 40** | **504** | **22.87** | **1085** | **49.23** |
| 21 - 30 | 387 | 17.56 | 581 | 26.36 |
| 11-20 | 181 | 8.21 | 194 | 8.80 |
| 01 - 10 | 13 | 0.59 | 13 | 0.59 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |


**වගුව 4**

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 31 - 40 පන්ති ප්‍රාන්තරය සලකා බලන විට,
මෙම විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2204 දෙනා අතුරෙන්, 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 504කි. එය ප්‍රතිශතයක් වශයෙන් 22.87%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 1085ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 49.23%කි.

1.3 විෂයය සාධනය පිළිබඳ විශ්ලේෂණය


1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/5/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

උදා:- ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා අකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත. අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ මෙම ප්‍රශ්න පත්‍රයේ 2වන ප්‍රශ්නයට ය. එහි පහසුතාව 93%කි. එමෙන්ම අපේක්ෂකයන් අඩුම සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 9වන ප්‍රශ්නයට ය. එහි පහසුතාව 10%කි.

## 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :-

මෙහි 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වන අතර එයින් පළමු ප්‍රශ්නය තෝරාගත් ප්‍රතිශතය 97.63%කි. දෙවන ප්‍රශ්නය තෝරාගත් ප්‍රතිශතය 96.05%කි. අංක 3 සිට 8 දක්වා ප්‍රශ්න අතුරින් ප්‍රශ්න 3ක් පමණක් තෝරාගත යුතු වූ අතර එයින් අපේක්ෂකයන් වැඩි පිරිසක් තෝරා ගෙන ඇත්තේ 3,4 හා 6වන ප්‍රශ්න වේ. ඒවායෙහි ප්‍රතිශතයන් පිළිවෙලින් 68.16%, 52.63%, 56.32%ක් වේ. අඩුම අපේක්ෂකයන් සංඛ්‍යාවක් තෝරාගෙන ඇත්තේ 5වන ප්‍රශ්නයයි. එය ප්‍රතිශතයක් ලෙස 28.95%කි.

ප්‍රස්තාරය 2 (RD/16/2/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

## 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.


උදා :-

මෙහි එක් ප්‍රශ්නයක් සඳහා වෙන් කර ඇති ලකුණු සංඛ්‍යාව 12කි. ප්‍රශ්න අංක 1හි 76% - 100% ප්‍රාන්තරය තුළ එනම් ලකුණු 10 - 12 අතර ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 20.75%කි. එමෙන්ම 00 - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 - 3 අතර ලබාගත් ප්‍රතිශතය 15.36%කි.

වඩාත් කැපී පෙනෙන ලෙස පහළ ම ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇත්තේ 3වන ප්‍රශ්නයටයි. 0 - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0-3 අතර ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 59.85%කි. තවද 76% -100% ප්‍රාන්තරයේ ලකුණු 10-12 අතර ලබාගත් ප්‍රතිශතය 3.09%කි.

ප්‍රස්තාරය 3 (RD/16/2/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4 (RD/16/4/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අංක 2 ප්‍රශ්නයේ (ii) කොටසේ (a) අනුකොටසෙහි පහසුතාව 98%කි. මෙම ප්‍රශ්න අතරෙන් අඩුම පහසුතාව පෙන්වන්නේ 2 ප්‍රශ්නයේ (I) කොටසේ (C) අනුකොටස හා 6 ප්‍රශ්නයේ (ii) අනුකොටසයි. එම පහසුතාවයන් 10% බැගින් වේ.

# II කොටස

## 2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

| | | |
|---|---|---|
| I පත්‍රය | - | **කාලය : පැය 01යි.** |
| | ⋆ | වරණ 4 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40කි. එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ 4 අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණය තේරීම අපේක්ෂා කෙරේ. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. |
| | ⋆ | එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි. |

## 2.1.2 I ප්‍රශ්න පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**Note :**

* Answer **all** questions. This paper carries **40** marks.
* In each of the questions from **1** to **40**, select one of the alternatives (1), (2), (3), (4) which is **correct or most appropriate**.
* **Mark a cross (x) on the number corresponding to your choice in the answer sheet provided.**
* Read the instructions given on the back of the answer sheet and follow them also.

1. පාලි අක්ෂරමාලාවේ ඝෝෂාක්ෂර සංඛ්‍යාව,
   The voiced consonants of Pali alphabet are
   (1) 21 කි. 21.  (2) 20 කි. 20.  (3) 11 කි. 11.  (4) 10 කි. 10.

2. අකාරාදි පිළිවෙළ අනුව පද ගළපා ඇති වරණය තෝරන්න.
   Select the option consisting of words arranged alphabetically.
   (1) මජ්ඣිමකාලො, මොචයිංසු, ආනුපුබ්බීකථං, අබ්‍රාහ්මණො
   majjhimakālo, mocayiṃsu, ānupubbīkathaṃ, abrāhmaṇo
   (2) අබ්‍රාහ්මණො, ආනුපුබ්බීකථං, මජ්ඣිමකාලො, මොචයිංසු
   abrāhmaṇo, ānupubbīkathaṃ, majjhimakālo, mocayiṃsu
   (3) මජ්ඣිමකාලො, අබ්‍රාහ්මණො, මොචයිංසු, ආනුපුබ්බීකථං
   majjhimakālo, abrāhmaṇo, mocayiṃsu, ānupubbīkathaṃ
   (4) ආනුපුබ්බීකථං, මොචයිංසු, මජ්ඣිමකාලො, අබ්‍රාහ්මණො
   ānupubbīkathaṃ, mocayiṃsu, majjhimakālo, abrāhmaṇo

3. දන්තජාක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   Select the option that includes only dental letters.
   (1) ට , ධ , බ , න
   ṭa, dha, ba, na
   (2) ඉ , ල , ප , ස
   i, la, pa, sa
   (3) ර , හ , ජ , ච
   ra, ha, ja, ca
   (4) ථ , ද , ස , ල
   tha, da, sa, la

4. අසවර්ණ ලෙස හඳුන්වනු ලබන්නේ
   Dissimilar vowels are
   (1) එ , ඉ යන අකුරු ය.
   e, i.
   (2) එ , උ යන අකුරු ය.
   e, u.
   (3) එ , ඔ යන අකුරු ය.
   e, o.
   (4) ඊ , ඌ යන අකුරු ය.
   ī, ū.

5. 37 හා 77 යන සංඛ්‍යා නිවැරදි ව පාලියෙන් ප්‍රකාශ කරන සංඛ්‍යා නාම ඇතුළත් වරණය තෝරන්න.
Select the option that expresses Pāli numbers 37 and 77 correctly.

(1) සත්තතිංසති, සත්තසත්තති
sattatiṃsati, sattasattati

(2) සත්තචත්තාළීසති, සත්තපඤ්ඤාසති
sattacattāḷīsatī, sattapaññāsati

(3) සත්තතිංසති, සත්තපඤ්ඤාසති
sattatiṃsati, sattapaññāsati

(4) සත්තචත්තාළීසති, සත්තවීසති
sattacattāḷīsatī, sattavīsati

6. "අපාදානෙ පඤ්චමී" යන බාලාවතාර සූත්‍රයට නිදසුන් කළ හැකි පාලි වාක්‍යය තෝරන්න.
Select the Pali sentence which will be an example for the Bālāvatāra sūtra, "apādāne pañcamī".

(1) දාත්තෙන සාලිං ලුනාති
Dāttena sāliṃ lunāti

(2) ආකාසෙ සකුණා චරන්ති
Ākāse sakuṇā caranti

(3) උපජ්ඣායම්හා සික්ඛං ගණ්හාති
Upajjhāyamhā sikkhaṃ gaṇhāti

(4) බුද්ධෙන ධම්මො දෙසිතො
Buddhena dhammo desito

7. 'සුභික්ඛං' යනු
'Subhikkhaṃ' is a

(1) සමාස පදයකි.
Compound.

(2) තද්ධිත පදයකි.
Secondary derivative (taddhita).

(3) කිතක පදයකි.
Primary derivative (kitaka).

(4) සන්ධි පදයකි.
Sandhi.

8. බහුබ්බීහි සමාස පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
Select the option that includes only bahubbīhi compounds.

(1) උපනගරං, අනුවාතං
upanagaraṃ, anuvātaṃ

(2) තෙවිජ්ජො, ජිතින්ද්‍රියො
tevijjo, jitindriyo

(3) මුනිසීහො, අත්තදිට්ඨි
munisīho, attadiṭṭhi

(4) මාතාපිතරො, මුඛනාසිකං
mātāpitaro, mukhanāsikaṃ

9. 'ධම්මරතො' යන්නෙහි නිවැරදි විග්‍රහ වාක්‍යය වන්නේ,
The correct analytical sentence of 'dhammarato' will be

(1) ධම්මස්ස රතො යන්න යි.
dhammassa rato.

(2) ධම්මං රතො යන්න යි.
dhammaṃ rato.

(3) ධම්මා රතො යන්න යි.
dhammā rato.

(4) ධම්මෙ රතො යන්න යි.
dhamme rato.

10. "උල්ලිඛාපෙති" යන්නෙහි අර්ථය වන්නේ
The meaning of "ullikhāpeti" is

(1) කොණ්ඩය පීරයි යන්න යි.
combing the hair.

(2) කොණ්ඩය පීරවයි යන්න යි.
make someone to comb the hair.

(3) කොණ්ඩය කපයි යන්න යි.
cutting the hair.

(4) කොණ්ඩය කපවයි යන්න යි.
make someone to cut the hair.

11. අර්ථයෙන් සමාන නොවන නිපාත යුගලය ඇතුළත් වරණය තෝරන්න.
Select the option that includes a pair of indeclinable (nipāta) dissimilar in meaning.

(1) අධුනා - එතරහි
adhunā - etarahi

(2) වත - නූන
vata - nūna

(3) මිච්ඡා - මුසා
micchā - musā

(4) ධුවං - ඛිප්පං
dhuvaṃ - khippaṃ

12. "ඉධමාහු" යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ,
The correct disjoining of 'idhamāhu' is

(1) ඉධං + ආහු යන්න යි.
idham + āhu

(2) ඉධ + මාහු යන්න යි.
idha + māhu

(3) ඉධ + ආහු යන්න යි.
idha + āhu

(4) ඉධං + මාහු යන්න යි.
idhaṃ + māhu

13. 'ඒකාන්තයෙන්' යන අර්ථය ඇති නිපාත පදය තෝරන්න.
Select the indeclinable (nipāta) bearing the meaning of "definitely".

(1) අද්ධා
addhā

(2) අබ්භුම්මෙ
abbhumme

(3) අධුනා
adhunā

(4) අඤ්ඤථා
aññathā

14. භූවාදි ගණයට අයත් ධාතුවලින් සෑදුණු ක්‍රියා පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
Select the option that includes only the verbs derived from roots belonging to bhuvādi gaṇa

(1) කිණාති, භවති, ධාවති, පචති
kiṇāti, bhavati, dhāvati, pacati

(2) පිබති, භවති, ධාවති, හසති
pibati, bhavati, dhāvati, hasati

(3) සුණාති, භවති, චොරයති, කිණාති
suṇāti, bhavati, corayati, kiṇāti

(4) ධාවති, චොරයති, පචති, කරොති
dhāvati, corayati, pacati, karoti

15. පඤ්චමී ආඛ්‍යාත පදයක් නොයෙදුණු පාලි වාක්‍යය තෝරන්න.
Select the Pali sentence that does not include a pañcamī ākhyāta pada.

(1) දෙවො වස්සතු කාලෙන
devo vassatu kālena

(2) නික්ඛම සමණ පවිස සමණ
Nikkhama samaṇa pavisa samaṇa

(3) පටිජග්ගෙය්‍ය පණ්ඩිතො
Paṭijaggeyya paṇḍito

(4) සබ්බෙව භූතා සුමනා භවන්තු
Sabbeva bhūtā sumanā bhavantu

16. පූර්වස්වර ලෝපය පිළිබඳ ඉගැන්වෙන බාලාවතාර සූත්‍රය තෝරන්න.
Select the Bālāvatāra sūtra that teaches the deletion of pūrvasvara.

(1) සරා සරෙ ලොපං
sarā sare lopaṃ

(2) ක්වචි ලොපං
kvaci lopaṃ

(3) සරෙ ක්වචි
sare kvaci

(4) ක්වචාසවණ්ණං ලුත්තෙ
kvacāsavannm lutte

17. 'අග්ගලසූචිං' යන්නෙහි අර්ථය වන්නේ
The meaning of "aggalasūciṃ" is

(1) දොරපළුව යන්න යි.
Door part.

(2) ඇඳපොල්ල යන්න යි.
Bed stick

(3) දොරපොල්ල යන්න යි.
Door stick.

(4) සැරමිටිය යන්න යි.
Stick.

18. *A* – මොහවිච්ඡෙදනී
Mohavicchedanī

*B* – අභිධම්මත්‍ථපුරාණටීකා
abhidhammatthapurāṇaṭīkā

*C* – මනොරථපූරණීටීකා
Manorathapūraṇīṭīkā

*D* – සාරත්‍ථදීපනීටීකා
Sāratthadīpanīṭīkā

ඉහත සඳහන් ඒවායින් දිඹුලාගල කාශ්‍යප හිමියන් විසින් සම්පාදනය කරන ලද ටීකා යුගලය වන්නේ
The pair of ṭīkā composed by Ven. Dimbulāgala Kāśyapa out of the above texts are

(1) *A* සහ *B* ය.
*A* and *B*.

(2) *B* සහ *D* ය.
*B* and *D*.

(3) *C* සහ *D* ය.
*C* and *D*.

(4) *A* සහ *C* ය.
*A* and *C*.

19. උදාන
Udānās are preached by

(1) පසේ බුදුවරුන් විසින් දේශිත ය.
Paccekabuddhas.

(2) බුදුවරුන් විසින් දේශිත ය.
Buddhas.

(3) රහත් තෙරවරුන් විසින් දේශිත ය.
Male Arahants.

(4) රහත් තෙරණියන් විසින් දේශිත ය.
Female Arahants.

20. ථෙරී අපදානයෙහි ඇතුළත් අපදන සංඛ්‍යාව වන්නේ
The number of Apadānās included in Theri Apadāna is

(1) 30 කි.
30.

(2) 40 කි.
40.

(3) 50 කි.
50.

(4) 60 කි.
60.

21. පාලි භාෂාවේ ආඛ්‍යාත විභක්ති ගණන
The number of ākhyāta vibhakti in Pali language is

(1) 05 කි.
05.

(2) 07 කි.
07.

(3) 08 කි.
08.

(4) 10 කි.
10.

22. 'කත්තබ්බං' යනු
The term "kattabbaṃ" is

(1) අතීත කිතක පදයකි.
past primary derivative (kitaka).

(2) අනාගත කිතක පදයකි.
future primary derivative (kitaka).

(3) ත්‍රෛකාලික කිතක පදයකි.
traikālīka primary derivative (kitaka).

(4) වර්තමාන කිතක පදයකි.
present primary derivative (kitaka).

23. "අථ ඛො ආයස්මා නන්දො ................. රත්තියා අච්චයෙන යෙන ................. තෙනුපසංකමි."
යන වැකියෙහි හිස්තැන්වලට අනුපිළිවෙළින් වඩාත් උචිත පද මොනවාද?
What are the most suitable words for the sentence, "Atha kho āyasmā Nando ................. rattiyā accayena yena ................. tenupasaṃkami."

(1) සො - භගවා
so - bhagavā.

(2) තස්සා - භගවතො
tassā - bhagavato.

(3) තස්සා - භගවා
tassā - bhagavā.

(4) තෙන - භගවතා
tena - bhagavatā.

24. "සුඛිනො වත යෙ අකිඤ්චනා ..." යනා දී උදානයෙහි අවසාන පාදය වන්නේ
The final line (pāda) of the udāna: "Sukhino vata ye akiñcanā etc" is

(1) සුඛදුක්ඛෙසු න වෙධති.
sukhadukkhesu na vedhati.

(2) ජනො ජනස්මිං පටිබද්ධචිත්තො.
jano janasmiṃ paṭibaddhacitto.

(3) සකිඤ්චනං පස්ස විහඤ්ඤමානං.
sakiñcanaṃ passa vihaññamānaṃ.

(4) මද්දිතො කාමකණ්ටකො.
maddito kāmakaṇṭako.

25. "පුබ්බදෙවතාති මාතාපිතූනං එතං අධිවචනං" යන්නෙහි නිවැරදි අර්ථය දෙන වරණය තෝරන්න.
Select the option that gives the correct meaning of "pubbadevatāti mātāpitūnaṃ etaṃ adhivacanaṃ".

(1) පූර්ව දෙවිවරු යනු මව්පියන් සඳහා අපර නාමයකි.
Pūrvadeva is another name for parents.

(2) මව්පියන් යනු ලෝකයේ පළමු දෙවිවරු ය.
Parents are the first gods of the world.

(3) පූර්ව දෙවිවරු මව්පියන් සඳහා අධික වචනයකි.
Pūrvadeva is a higher word for parents.

(4) පූර්ව දෙවිවරු මව්පියන් හා සමාන ය.
Pūrvadevas are equal to parents.

26. "ඒ මුඬුමහණෝ පැන් නොබොත්වා" යන අර්ථය දෙන පාලි වාක්‍යය තෝරන්න.
Select the Pali sentence which carries the meaning: "Those sama ās with shaven head may not drink water".

(1) තෙ මුණ්ඩකා සමණකා පානීයං පිවෙය්‍යුං.
Te muṇdakā samaṇakā pānīyaṃ piveyyum.

(2) මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසු.
Mā te muṇdakā samaṇakā pānīyaṃ apaṃsu.

(3) තෙ මුණ්ඩකා සමණකා පානීයං පිවන්තු.
Te muṇdakā samaṇakā pānīyaṃ pivantu.

(4) තෙ මුණ්ඩකා සමණකො පානීයං න පිවතු.
Te muṇḍakā samaṇako pānīyaṃ na pivatu.

27. ථෙරා නවහි මාසෙහි සංගීතිං අකංසු යන්නෙහි විභක්ති ප්‍රයෝගය වන්නේ
The case function of Therā navahi māsehi saṃgītiṃ akamsu is

(1) ක්‍රියා, ප්‍රවර්ගාර්ථයේ තතියා ය.
tatiyā of kriyāpravarga.

(2) අනුක්ත කර්තෘ අර්ථයේ තතියා ය.
tatiyā of anukta kartru.

(3) සහාදි යෝගයේ තතියා ය.
tatiyā of sahādi yoga.

(4) ක්‍රියා විශේෂණාර්ථයේ තතියා ය.
tatiyā of kriyā visesaṇārtha.

28. නමො, සොත්ථි යන නිපාත පද යොදනු ලබන්නේ
Indeclinables such as 'namo', 'sotthi' are used with

(1) තතියා විභක්තිය සමග ය.
Tatiyā case.

(2) චතුත්ථි විභක්තිය සමග ය.
Catutthi case.

(3) පඤ්චමී විභක්තිය සමග ය.
Pañcamī case.

(4) ඡට්ඨී විභක්තිය සමග ය.
Chaṭṭhi case.

29. "සත්තධා මෙ ඵලෙ මුද්ධා" යන්නෙහි අංකිත පදය අයත් තද්ධිත ප්‍රභේදය තෝරන්න.
Select the secondary derivative (taddhita) variety of the underline word of "sattadhā me phale muddhā"

(1) අත්‍ථ්‍යත්ථ තද්ධිත
atthyattha

(2) සංඛ්‍යා තද්ධිත
saṃkhyā

(3) අනෙකත්ථ තද්ධිත
anekattha

(4) අව්‍යය තද්ධිත
avyaya

30. කිතක පදයක් යනු
Primary derivative is a

(1) ධාතුවකට ප්‍රත්‍යය එකතු වී සෑදෙන පදයක් ය.
word formed by adding suffix to a root.
(2) නාමයකට ප්‍රත්‍යය එකතු වී සෑදෙන පදයක් ය.
word formed by adding suffix to a noun.
(3) නාමපද දෙකක් එකතු වී සෑදෙන පදයක් ය.
word formed by combing two nouns.
(4) වර නොනැගෙන පදයක් ය.
an indeclinable word.

- පහත සඳහන් ගාථා ඇසුරෙන් **31** සිට **35** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
Answer questions from **31** to **35** with reference to the following verse.

භික්ඛුනීනිලයො සුඤ්ඤො භූතො තාහි විනා අයං,
පභාතෙ විය තාරායො න දිස්සන්ති ජිනොරසා.

නිබ්බානං ගොතමී යාති සතෙහි සහ පඤ්චහි,
නදීසතෙහිව සහ ගඞ්ගා පඤ්චහි සාගරං.

රථිකාය වජන්තිං තං දිස්වා සද්ධා උපාසිකා,
ඝරා නික්ඛම්ම පාදෙසු නිපච්ච ඉදමබ්‍රවුං:

"පසීදස්සු මහාභොගෙ අනාථායො විහාය නො,
තයා න යුත්තං නිබ්බාතුං" ඉච්චට්ටං විලපිංසු තා

Bhikkunīnilayo suñño bhūto tāhi vinā ayaṃ,
pabhāte viya tārāyo na dissanti jinorasā.

Nibbānaṃ gotamī yāti satehi saha pañcahi,
nadīsatehiva saha gaṅgā pañcahi sāgaraṃ.

Rathikāya vajantiṃ taṃ disvā saddhā upāsikā,
gharā nikkhamma pādesu nipacca idamabravuṃ:

"Pasīdassu mahābhoge anāthāyo vihāya no,
tayā na yuttaṃ nibbātuṃ" iccaṭṭaṃ vilapiṃsu tā

31. උපමාවක් ලෙස භාවිත යෙදුම වන්නේ
The idiom used as a simile is

(1) භික්ඛුනීනිලයො සුඤ්ඤො යන්න ය.
bhikkunīnilayo suñño.
(2) පභාතෙ විය තාරායො යන්න ය.
pabhāte viya tārāyo.
(3) නදීසතෙහි සහ ගඞ්ගා යන්න ය.
nadīsatehi saha gangā.
(4) සතෙහි සහ පඤ්චහි යන්න ය.
satehi saha pañcahi.

32. ඉච්චට්ටං යන්නෙහි නිවැරදි විසන්ධිය තෝරන්න.
Select the correct visandhi of 'iccaṭṭam'.

(1) ඉච්ච+අට්ටං
icca+aṭṭaṃ
(2) ඉච්+අට්ටං
ic+aṭṭaṃ
(3) ඉති+අට්ටං
iti+aṭṭaṃ
(4) ඉච්ච්+අට්ටං
icc+aṭṭaṃ

33. "මහා පිනැති උත්තමාවනි, ඔබ නැති ව අපි අනාථ වෙමු ඔබගේ පිරිනිවීම නොසුදුසුයැයි, වැලපුණේ කවරහු ද?
Who wept saying the following: The great noble lady with merit! we become helpless without you, your parinibbāna is improper?

(1) ආනන්ද තෙරුන් වහන්සේ
Ven. Ānanda
(2) සැදැහැති උපාසක උපාසිකාවෝ
failthful male and female devotees
(3) රහත් නොවූ මෙහෙණිවරු
Nuns who are not arahants
(4) මඟ දෙපස වැසි සැදැහැති උපාසිකාවන්
failthful female devotees living on either side of the road

34. 'පසීදස්සු' යන පදය අයත් වන ආඛ්‍යාත විභක්තිය කුමක් ද?
What is the ākyāta vibhakti of the word 'pasidassu'?

(1) වත්තමානා
vattamānā

(2) පංචමී
pañcamī

(3) සත්තමී
sattamī

(4) කාලාතිපත්ති
kālātipatti

35. 'නිපච්ච' යන පදය
The word 'nipacca' is

(1) සන්ධියකි.
sandhi.

(2) සමාසයකි.
samāsa.

(3) පූර්ව ක්‍රියාවකි.
pūrvakriyā.

(4) තද්ධිතයකි.
taddhita.

36. "සාකියානී මං භන්තෙ ජනපදකල්‍යාණී ඝරා නික්ඛමන්තස්ස උපඩ්ඪුල්ලිඛිතෙහි කෙසෙහි අපලොකෙත්වා මං එතදවොච" යන්නෙහි අංකිත පදයේ අර්ථය වන්නේ
The meaning of the word printed in bold letters of the sentence, "sākiyāni maṃ bhante janapadakalyāṇi gharā nikkhamantassa upaḍḍhullikhitehi kesehi apaloketvā maṃ etadavoca" will be

(1) අඩක් පීරන ලද යන්න ය.
half combed.

(2) අඩක් ගොතන ලද යන්න ය.
half knitted.

(3) මදක් තෙත් වූ යන්න ය.
slightly wet.

(4) ලිහා දමන ලද යන්න ය.
untied.

37. රිස් ඩේවිඩ්ස් පඬිතුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
Select the correct statement related to the scholar Rhys Davids.

(1) ඔහු පාලිභාෂාවට ව්‍යාකරණ ග්‍රන්ථයක් සම්පාදනය කළේය.
Composed a grammar for Pali language.

(2) බුරුම බසින් තිබූ පාලිභාසප්පවෙසනී ග්‍රන්ථය ඉංග්‍රීසි බසට නැගීය.
Translated Pālibhāsappavesanī written in Burmese into English.

(3) භාරතීය බෞද්ධාචාර්යයෝ ග්‍රන්ථයේ කතුවරයා ය.
Author of the text "Bhāratīya Bauddhācāryayo".

(4) පාලි ඉංග්‍රීසි මහාශබ්දකෝෂයේ කතුවරයා ය.
Author of Pali–English Dictionary.

38. සූත්‍ර පිටකය හැඳින්වීමට භාවිත කරන අපර නාමයක් වන්නේ
Another name used for identifying sūtra pitaka is

(1) ආණා දෙසනා
āṇā desanā

(2) වොහාර දෙසනා
vohāra desanā

(3) පරමත්ථ දෙසනා
paramattha desanā

(4) සාමුක්කංස දෙසනා
sāmukkaṃsa desanā

39. සංගාමජී සූත්‍රය
Saṃgāmajī sūtra is

(1) නන්ද වග්ගයේ 3 වන සූත්‍රය යි.
3rd sūtra of Nanda Vagga.

(2) මුචලින්ද වග්ගයේ 9 වන සූත්‍රය යි.
9th sūtra of Mucalinda Vagga.

(3) බෝධි වග්ගයේ 8 වන සූත්‍රය යි.
8th sūtra of Bodhivagga.

(4) චූලවග්ගයේ 6 වන සූත්‍රය යි.
6th sūtra of Culla Vagga.

40. *A* – මහාට්ඨකථා
Mahāṭṭhakathā

*B* – මහාපච්චරියට්ඨකථා
Mahāpaccariyaṭṭhakathā

*C* – ජාතකට්ඨකථා
Jātakaṭṭhakathā

*D* – කුරුන්දට්ඨකථා
Kurundaṭṭhakathā

*E* – විභංගට්ඨකථා
Vibhaṃgaṭṭhakathā

ඉහත සඳහන් ඒවායින් බුද්ධඝෝෂ මාහිමියන්ට අටුවාකරණයේ දී මූලාශ්‍රය වූ හෙළටුවා පමණක් ඇතුළත් වරණය තෝරන්න.

Select the option which includes only Heḷāṭuvā, the source for commentarial work of Ven. Buddhaghoṣha out of the above texts.

(1) *A B C* (2) *A B D* (3) *B C D* (4) *B D E*

* * *

**2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 1 | 21. | 3 |
| 02. | 2 | 22. | 3 |
| 03. | 4 | 23. | 3 |
| 04. | 3 | 24. | 2 |
| 05. | 1 | 25. | 1 |
| 06. | 3 | 26. | 2 |
| 07. | 1 | 27. | 1 |
| 08. | 2 | 28. | 2 |
| 09. | 4 | 29. | 4 |
| 10. | 2 | 30. | 1 |
| 11. | 4 | 31. | 2 |
| 12. | 3 | 32. | 3 |
| 13. | 1 | 33. | 4 |
| 14. | 2 | 34. | 2 |
| 15. | 3 | 35. | 3 |
| 16. | 1 | 36. | 1 |
| 17. | 3 | 37. | 4 |
| 18. | 1 | 38. | 2 |
| 19. | 2 | 39. | 3 |
| 20. | 2 | 40. | 2 |


වගුව 05
නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 කි.

### 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව)

1 ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා තුනකි. ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය මෙසේය.

| තේමාව | ප්‍රශ්න අංකය |
|---|---|
| ව්‍යාකරණ | 1,2,3,4,5,6,7,8,9,11,12,13,14,15,16,21,22,23,28,29,30,32,34,35 |
| පරිවර්තන | 10,17,26,36 |
| සාහිත්‍යය | 18,19,20,24,25,27,31,33,37,38,39,40 |

වගුව 06





ප්‍රස්තාරය 05

ව්‍යාකරණ තේමාව යටතේ ඇති ප්‍රශ්න 24 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ 2වන ප්‍රශ්නය යි. එය මුළු පත්‍රයේ ම පහසුම ප්‍රශ්නය ද වේ. එහි පහසුතාවය 93%කි. 1 පත්‍රයේ පහසුතාව අඩුම ප්‍රශ්නය ව්‍යාකරණ තේමාව යටතේ ම ඇති 9වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 10%කි. ඉහත ව්‍යාකරණ තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් 50%ක් හෝ ඊට වැඩි පහසුතාවයක් ඇති ප්‍රශ්න 9කි. ඒවානම් 1,2,3,4,5,14,16,21,30 යන ප්‍රශ්නයි. 30%ක් හෝ ඊට වඩා අඩු පහසුතාවක් ඇති ප්‍රශ්න 07කි. ඒවා නම් 9,11,12,13,22,29,34 වේ.

පරිවර්තන තේමාව යටතේ ඇති ප්‍රශ්න 4 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ 17වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 56%කි. පහසුතාව අඩුම ප්‍රශ්නය වන්නේ 26වන ප්‍රශ්නය යි. එහි පහසුතාවය 17%කි. පරිවර්තන ප්‍රශ්න 4න් පහසුතාව 50%ට වැඩි ප්‍රශ්න ඇත්තේ දෙකකි.

සාහිත්‍යය තේමාව යටතේ ප්‍රශ්න 12කි. ඒ අතුරෙන් වැඩිම පහසුතාව ඇත්තේ 19වන ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 72%කි. අඩුම පහසුතාව ඇති ප්‍රශ්නය වන්නේ 33වන ප්‍රශ්නය යි. එය පහසුතාව 27%කි. සාහිත්‍ය තේමා ප්‍රශ්නවල 50%ට වඩා වැඩි ප්‍රතිශතයක් ඇති ප්‍රශ්න කිහිපයකි. ඒවානම් 19,20,31,38,39,40 යන ප්‍රශ්නයි.

සමස්ත පහසුතාව




ප්‍රස්තාරය 05 I

1 පත්‍රයේ සමස්ත පහසුතාවය 47.15%කි. එය ව්‍යාකරණ, පරිවර්තන, සාහිත්‍යය යන තේමා අනුව ප්‍රශ්නවල සමස්ත පහසුතාව පහත දැක් වේ.

| තේමාව | ප්‍රශ්නවල සමස්ත පහසුතාව |
|---|---|
| ව්‍යාකරණ | 47.37% |
| පරිවර්තන | 37.75% |
| සාහිත්‍යය | 49.83% |

වගුව 7

## 2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | Missing |
| 1 | 1 | 74.93 | 5.36 | 16.08 | 3.25 | 0.38 |
| 2 | 2 | 1.44 | 93.21 | 2.58 | 2.78 | 0.00 |
| 3 | 4 | 4.21 | 2.68 | 6.03 | 86.99 | 0.10 |
| 4 | 3 | 10.14 | 9.28 | 69.38 | 10.81 | 0.38 |
| 5 | 1 | 86.03 | 4.59 | 5.74 | 3.44 | 0.19 |
| 6 | 3 | 15.12 | 17.70 | 48.71 | 18.09 | 0.38 |
| 7 | 1 | 35.22 | 25.07 | 14.83 | 24.31 | 0.57 |
| 8 | 2 | 23.54 | 36.75 | 19.62 | 19.14 | 0.96 |
| 9 | 4 | 44.31 | 36.46 | 8.80 | 10.24 | 0.19 |
| 10 | 2 | 47.37 | 25.17 | 18.85 | 8.42 | 0.19 |
| 11 | 4 | 40.96 | 15.89 | 13.68 | 28.90 | 0.57 |
| 12 | 3 | 51.29 | 16.94 | 19.62 | 11.87 | 0.29 |
| 13 | 1 | 23.83 | 16.27 | 35.50 | 23.83 | 0.57 |
| 14 | 2 | 17.03 | 53.78 | 18.66 | 10.05 | 0.48 |
| 15 | 3 | 14.74 | 23.35 | 48.71 | 12.73 | 0.48 |
| 16 | 1 | 83.83 | 8.23 | 4.02 | 3.73 | 0.19 |
| 17 | 3 | 10.91 | 12.44 | 56.27 | 19.52 | 0.86 |
| 18 | 1 | 49.09 | 30.14 | 16.27 | 3.92 | 0.57 |
| 19 | 2 | 10.53 | 71.77 | 10.43 | 6.51 | 0.77 |
| 20 | 2 | 10.14 | 68.33 | 7.66 | 13.30 | 0.57 |
| 21 | 3 | 3.25 | 32.44 | 61.24 | 2.58 | 0.48 |
| 22 | 3 | 24.69 | 29.47 | 29.28 | 15.41 | 1.15 |
| 23 | 3 | 19.33 | 14.35 | 44.02 | 21.53 | 0.77 |
| 24 | 2 | 34.64 | 32.06 | 23.44 | 9.09 | 0.77 |
| 25 | 1 | 48.23 | 10.43 | 32.63 | 8.42 | 0.29 |
| 26 | 2 | 8.71 | 16.84 | 17.51 | 56.56 | 0.38 |
| 27 | 1 | 35.22 | 26.51 | 14.55 | 23.44 | 0.29 |
| 28 | 2 | 18.66 | 40.96 | 24.21 | 15.69 | 0.48 |
| 29 | 4 | 10.72 | 53.88 | 20.96 | 13.78 | 0.67 |
| 30 | 1 | 50.14 | 16.46 | 7.46 | 25.36 | 0.57 |
| 31 | 2 | 15.41 | 55.69 | 25.17 | 3.16 | 0.57 |
| 32 | 3 | 26.60 | 21.34 | 32.54 | 19.04 | 0.48 |
| 33 | 4 | 15.50 | 20.67 | 36.08 | 27.18 | 0.57 |
| 34 | 2 | 7.75 | 23.54 | 38.95 | 29.47 | 0.29 |
| 35 | 3 | 19.90 | 19.14 | 39.62 | 20.86 | 0.48 |
| 36 | 1 | 53.40 | 14.16 | 15.98 | 15.79 | 0.67 |
| 37 | 4 | 18.56 | 24.21 | 8.61 | 47.56 | 1.05 |
| 38 | 2 | 30.33 | 54.35 | 12.15 | 2.39 | 0.77 |
| 39 | 3 | 25.74 | 12.34 | 53.97 | 7.18 | 0.77 |
| 40 | 2 | 22.11 | 54.93 | 12.73 | 9.47 | 0.77 |

වගුව 8

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

### 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

2019 වර්ෂයේ පාලි විෂය I පත්‍රය සැකසීමේ දී ව්‍යාකරණ තේමාවට අදාළ ව ප්‍රශ්න 24ක් ද, පරිවර්තන තේමාවට අදාළ ව ප්‍රශ්න 04ක් ද, සාහිත්‍ය තේමාවට අදාළ ව ප්‍රශ්න 12ක් ද ඇතුළත් කර ඇත.
I පත්‍රයේ පහසුතාව 50% ඉක්ම වූ ප්‍රශ්න සංඛ්‍යාව 17කි. ඉන් ප්‍රශ්න 9ක් ම ව්‍යාකරණ තේමාවට අයත් වේ.

★ 2 වන ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර වන්නේ 2වන වරණයයි. එය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 93.21%කි. අක්ෂර මාලාව කාලාන්තරයක් තිස්සේ ඉගෙනීම මෙහි පහසුතාව වැඩි වීමට හේතුව විය හැකිය.

★ 3වන ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර වන්නේ 4වන වරණය යි. එය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 86.99%කි. අක්ෂර උත්පත්තිස්ථාන පිළිබඳ හොඳ වැටහීමක් තිබීම මෙහි පහසුතාව වැඩි වීමට හේතුව විය හැකිය.

★ 7වන ප්‍රශ්නයේ නිවැරදි වරණය 1වන වරණය වන අතර එය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 35.22%කි. එසේ වුවද අපේක්ෂකයන් අතුරින් 2වන වරණය 25.07%ක් හා 4වන වරණය 24.31%ක් ද තෝරාගෙන ඇත. ප්‍රශ්නය මනාව තේරුම් නොගෙන වරණ තෝරාගෙන ඇති බව පැහැදිලි වේ.

★ 9වන ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර 4වන වරණය වන අතර එය තෝරාගත් ප්‍රතිශතය 10.24%කි. 1වන වරණය 44.31%ක් ද 2වන වරණය 36.46%ක් ද තෝරා ගෙන ඇත. මෙයට හේතුව වන්නේ පද විග්‍රහය නිවැරදි ව තේරුම් නොගැනීම යි. පද විග්‍රහය පිළිබඳ ව සිසුන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු කිරීම අවශ්‍ය වන අතර දැනුම සහ ප්‍රායෝගික හුරුව වැඩිදියුණු කිරීම සඳහා විවිධ ආකාරයේ ප්‍රශ්න වැඩි සංඛ්‍යාවකට පිළිතුරු ලිවීමට අවකාශය ලබා දිය යුතු ය.

★ 22වන ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර වන්නේ 3වන වරණය යි. එය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 29.28%කි. එසේම 2වන වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 29.47%කි.

★ 24වන ප්‍රශ්නයේ නිවැරදි වරණය 2වන වරණයයි. එය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 32.06%ක් වේ. 1වන වරණය තෝරාගත් ප්‍රතිශතය 34.64%කි. ගාථාපාඨය අමතක වී අනුමානයට පිළිතුරු තෝරා ඇත. ඒ අනුව ගාථාපාඨ හොඳින් මතකයේ තබා ගැනීම සඳහා විවිධ වූ ක්‍රියාකාරකම් සිසුන් හට ලබා දිය යුතු ය.

★ 26වන ප්‍රශ්නයේ 4වන වරණය තෝරාගත් ප්‍රතිශතය 56.56%කි. එය වැරදි වරණයකි. නිවැරදි වරණය වන 2වන වරණය තෝරාගත් ප්‍රතිශතය වන්නේ 16.84%කි. ප්‍රතිෂේධාර්ථ මා නිපාතයේ යෙදීම පිළිබඳ වැටහීම නැතිවීම හා පිවතු, පිවන්තු යන වචන පිළිබඳ අවධානය යොමු කර තිබීම මෙයට හේතු විය හැකිය.

ඉහත සලකා බලන ලද නිදසුන්වලින් සමස්තයක් ලෙස නිගමනය කළ හැක්කේ ගුරුභවතුන් විසින් නිරවුල් ව සිසුන්ට ව්‍යාකරණ කරුණු පැහැදිලි කර නොමැති බවයි. විශේෂ ව්‍යාකරණ ප්‍රයෝග පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු ය. ව්‍යවහාරය ඇසුරින් ව්‍යාකරණ කරුණු ඉගැන්වීම ද කළ යුතු වන අතර එබඳු නිදසුන් බහුලව යොදා ගැනීම වැදගත් වේ.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

**II පත්‍රය -** කාලය : පැය **03යි.**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

I කොටස - අනිවාර්යය ප්‍රශ්න **දෙකකින්** සමන්විත ය.

1 ප්‍රශ්නය : නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීම
2 ප්‍රශ්නය : (i) කොටස - වාක්‍ය කිහිපයක් පාලියට පරිවර්තනය කිරීම
(ii) කොටස - පාලි ඡේදයක් ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
එක් ප්‍රශ්නයට ලකුණු 12 බැගින් ලකුණු 24කි.

II කොටස - ව්‍යූහගත රචනා වර්ගයේ ප්‍රශ්න **හයකින්** සමන්විත ය. ප්‍රශ්න **තුනකට** පිළිතුරු සැපයිය යුතු ය.
එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ලකුණු 36කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 24 + 36 = 60

අවසාන ලකුණු ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 40 |
| II පත්‍රය | = | 60 |
| අවසාන ලකුණ | = | 100 |

## 2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය සහ පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

1. (I) සිංහලට නගන්න.

අථ ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා තං දාරකං ආයස්මතො සඞ්ගාමජිස්ස පුරතො නික්ඛිපිත්වා පක්කාමි 'එස තෙ සමණ, පුත්තො. පොස න'න්ති. අථ ඛො ආයස්මා සඞ්ගාමජි තං දාරකං නෙව ඔලොකෙසි, නපි ආලපි. අථ ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා අවිදූරං ගන්ත්වා අපලොකෙන්තී අද්දස ආයස්මන්තං සඞ්ගාමජිං තං දාරකං නෙව ඔලොකෙන්තං නපි ආලපන්තං. දිස්වානස්සා එතදහොසි: 'න චායං සමණො පුත්තෙනපි අත්ථිකො'ති. තතො පටිනිවත්තිත්වා දාරකං ආදාය පක්කාමි. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකාය එවරූපං විප්පකාරං. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

ආයන්තිං නාභිනන්දති පක්කමන්තිං න සොචති,
සඞ්ගා සඞ්ගාමජිං මුත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණ'න්ති. **(ලකුණු 06යි)**

**(I) ආදර්ශ පරිවර්තනය**

ඉක්බිති ආයුෂ්මත් සංගාමජී තෙරුන්ගේ පෙර බිරිඳ ඒ දරුවා ආයුෂ්මත් සංගාමජී තෙරුන්ගේ ඉදිරියෙහි තබා "ශ්‍රමණය, ඔබගේ මේ පුතාය ඔහු පෝෂණය කරන්නැ'යි" ගියා ය. ඉක්බිති ආයුෂ්මත් සංගාමජී තෙර ඒ දරුවා දෙස නො බැලුවේ ය. කතා නො කළේ ය. ඉක්බිති ආයුෂ්මත් සංගාමජී තෙරුන්ගේ පෙර බිරිඳ නොදුරට ගොස් ආපසු බලන්නී ඒ දරුවා නො බලන කථා නො කරන ආයුෂ්මත් සංගාමජී තෙර දුටුවා ය. දැක ඇයට මෙම අදහස ඇති විය. "මේ ශ්‍රමණ තෙම පුත්‍රයාගෙනුදු ප්‍රයෝජන ඇත්තෙක් නො වේ" යනුවෙනි. ඉක්බිති නැවතී දරුවා රැගෙන ගියා ය. භාග්‍යවතුන් වහන්සේ වනාහි පිරිසිදු වූ මිනිස් ඇස ඉක්මවූ දිවැසින් ආයුෂ්මත් සංගාමජී තෙරුන්ගේ පෙර බිරිඳගේ මෙබඳු විප්‍රකාරය දුටු සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන එම වේලාවෙහි මේ උදානය උදන් ඇනූ සේක.

එන්නිය දැක සතුටු නො වෙයි. බැහැර යන්නිය දැක ශෝක නො කරයි. ඇලීම්වලින් මිදුණු ඒ සංගාමජී භික්ෂුව බ්‍රාහ්මණයෙකැ යි මම කියමි.

(II) සිංහලට නගන්න.

තාවතිංසෙසු දෙවෙසු සබ්බකාමසමිද්ධිසු,
නිබ්බත්තා දසහඞ්ගෙහි අඤ්ඤෙ අභිභවිං අහං.
රූපසද්දෙහි ගන්ධෙහි රසෙහි ඵුසනෙහි ච,
ආයුනාපි ච වණ්ණෙන සුඛෙන යසසාපි ච.
තථෙවාධිපතෙය්‍යෙන අධිගය්හ විරොච'හං,
අහොසිං අමරින්දස්ස මහෙසී දයිතා තහිං.


**(ලකුණු 06යි)**

(II) ආදර්ශ පරිවර්තනය

- සියලු කාමයන්ගෙන් සමෘද්ධ වූ තවුතිසා දෙවියන් අතර උපන් මම දස කරුණෙකින් සෙසු දෙවියන් ඉක්මවා සිටියෙමි.
- රූපයෙන් හා ශබ්දයෙන් ද ගන්ධයෙන් ද රසයෙන් ද ස්පර්ශයෙන් ද ආයුෂයෙන් ද වර්ණයෙන් ද සැපයෙන් ද කීර්තියෙන් ද
- එසේ ම අධිපතිභාවයෙන් ද, (සෙසු දෙවියන්) අභිභවා මම බැබළුණෙමි එහි දෙව්රජුගේ ප්‍රේමණීය මෙහෙසිය වීමි.

**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

**1 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය**





මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එසේ වුවත් පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 97.63%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 15%ක් ද,
ලකුණු 4 - 6 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 7 - 9 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 21%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 21%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 55%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 06 හෝ ඊට අඩුවෙනි.

**1 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව**




මෙම ප්‍රශ්නය නිර්දිෂ්ට පරිවර්තන කුසලතාව මනින ප්‍රශ්නයකි. පාලි භාෂාවෙන් දෙනු ලබන නිර්දිෂ්ට ගද්‍ය පාඨයක් හා පද්‍ය ගාථා 3ක් මෙම ප්‍රශ්නයට ඇතුළත් වන අතර එක් කොටසකට ලකුණු 6 බැගින් හිමි වේ. අපේක්ෂකයන්ට පදගතාර්ථ හෝ අන්වයානුකූල පරිවර්තනයක් සැපයීමට සිදු වේ. මේ සඳහා නිර්දිෂ්ට කොටස්වල අර්ථ පාඩම් කර තිබීම අවශ්‍ය ය. ඒ ඒ පරිවර්තනවලට ලකුණු පිරි නමා ඇති ආකාරය අනුව පහසුතාව පිළිවෙලින් 67%ක් හා 34%ක් විය.

සමස්තයක් ලෙස පරිවර්තනවලට ලකුණු ලබා ගැනීම සාර්ථක වුවත් පද්‍ය පරිවර්තනවලට ලකුණු ලබා ගැනීම දුර්වල මට්ටමක පැවතිණි. ගද්‍ය පාඨයේ උක්තාඛ්‍යාත සම්බන්ධය ගැලපීම, මනඃකල්පිත පරිවර්තන දැක්වීම, ඇතැම් පද මගහැර පරිවර්තනය කර තිබීම වැනි කරුණු දුර්වලතා ලෙස දැකිය හැකි ය. පද්‍ය පරිවර්තනවල අන්වය සකස්කර ගැනීම දුර්වල මට්ටමක පැවතිණි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨවලට අර්ථ පාඩම් කිරීම අත්‍යවශ්‍ය ය. ගුරුභවතුන් විසින් කොටස් වශයෙන් ගද්‍ය පද්‍ය කොටස් සිසුන් ලවා පරිවර්තනය කරවිය යුතු ය. දුර්වලතා හා අඩුපාඩු මගහරවා ගෙන සාර්ථක පරිවර්තනයකට ශිෂ්‍යයා යොමු කළ යුතු ය. ශිෂ්‍යයා විසින් ද ගුරු උපදේශ පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. ශිෂ්‍යයන් සමඟ සංවාද කරමින් මෙන්ම එක් අයෙකු පාලියෙන් කියූ වාක්‍යය අනෙක් අයෙකු විසින් පරිවර්තනය කිරීම වැනි ක්‍රියාකාරකම් සඳහා යොමු වීම වඩාත් යෝග්‍ය වනු ඇත.

**2 ප්‍රශ්නය**

2. (I) පාලියට නගන්න.

(අ). දේවතාවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතනට එළඹියේය.

(ආ). අනේපිඬු සිටුතුමා ද විශාඛා මහෝපාසිකාව ද නිතර තථාගතයන් වහන්සේට උපස්ථානයට යති.

(ඉ). පෙර රජවරු සතුරන් නසා ලක්දිව එක්සේසත් කළහ.

**(ලකුණු 06 යි)**

**(I) ආදර්ශ පරිවර්තනය**

(අ). දෙවො/ දෙවතා යෙන භගවා තෙනුපසඞ්කමි.

(ආ). අනාථපිණ්ඩිකො සෙට්ඨි ච විසාඛා මහාඋපාසිකා ච නිච්චං තථාගතස්සුපට්ඨානාය ගච්ඡන්ති.

(ඉ). පුබ්බෙ රාජානො අරයො හන්ත්වා ලඞ්කාදීපං එකච්ඡත්තං අකංසු.

(II) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අථ ඛො ආයස්මා රට්ඨපාලො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්‍වා පදක්ඛිණං කත්‍වා සෙනාසනං සංසාමෙත්‍වා පත්තචීවරං ආදාය යෙන ථුල්ලකොට්ඨිතං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන ථුල්ලකොට්ඨිතං තදවසරි. තත්‍ර සුදං ආයස්මා රට්ඨපාලො ථුල්ලකොට්ඨිතෙ විහරති රඤ්ඤො කොරව්‍යස්ස මිගාචීරෙ. අථ ඛො ආයස්මා රට්ඨපාලො පුබ්බණ්හසමයං නිවාසෙත්‍වා පත්තචීවරං ආදාය ථුල්ලකොට්ඨිතං පිණ්ඩාය පාවිසි. ථුල්ලකොට්ඨිතෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන සකපිතුනිවෙසනං තෙනුපසංකමි. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස පිතා මජ්ඣිමාය ද්වාරසාලාය උල්ලිඛාපෙති. අද්දසා ඛො ආයස්මතො රට්ඨපාලස්ස පිතා ආයස්මන්තං රට්ඨපාලං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන එතදවොච. "ඉමෙහි මුණ්ඩකෙහි සමණකෙහි අම්හාකං එකපුත්තකො පියො මනාපො පබ්බජිතො" ති. අථ ඛො ආයස්මා රට්ඨපාලො සකපිතුනිවෙසනෙ නෙව දානං අලත්‍ථ, න පච්චක්ඛානං, අඤ්ඤදත්‍ථු අක්කොසමෙව අලත්‍ථ. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස ඤාතිදාසි ආභිදොසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමා හොති. අථ ඛො ආයස්මා රට්ඨපාලො තං ඤාතිදාසිං එතදවොච. "සචෙ තං භගිනි, ඡඩ්ඩනීයධම්මං ඉධ මෙ පත්තෙ ආකිරා" ති.

(අ) රට්ඨපාල රහතන් වහන්සේගේ ගම කුමක් ද?

(ආ) කොරව්‍ය රජුගේ උයනේ නම කුමක් ද?

(ඉ) පක්කාමි, උල්ලිඛාපෙති යන පදවල අර්ථ දක්වන්න.

(ඊ) රට්ඨපාල තෙරුන්ට පියාගේ නිවසින් ලැබුණු දෙය හා නො ලැබුණු දේ මොනවා ද?

**(ලකුණු 1+ 1 + 2 + 2 = 06යි)**

**(II) ආදර්ශ පිළිතුර**

(අ) ථුල්ලකොට්ඨිත ගම


(ආ) මිගාචීරය

(ඉ) පක්කාමි - ගියේය
උල්ලිඛාපෙති - කොණ්ඩය පීරවයි

(ඊ) ලැබුණු දෑ - බැණුම්
නො ලැබුණු දෑ - එපාය යි කීම හෝ දානය

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**


**2 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය**




02වන ප්‍රශ්නය ද අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයකි. පිළිතුරු සපයා ඇති අපේක්ෂකයින් ප්‍රතිශතය 96.05% කි. මෙම ප්‍රශ්නය සඳහා ද ලකුණු 12ක් හිමි වේ.

ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 4 - 6 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 7 - 9 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 3%ක් ද,

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 3%කි. අපේක්ෂකයන්ගෙන් 28%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වන අතර (i) කොටස මාධ්‍ය භාෂාවෙන් ඇති වාක්‍ය 3 පාලි භාෂාවට නැගිය යුතු ය. නිවැරදි එක් වාක්‍යයකට ලකුණු 2 බැගින් හිමි වේ. වැරදි 2කට වඩා වැඩි වාක්‍යවලට ලකුණු හිමි නොවේ. සමස්තය සලකා වාක්‍ය 3ටම ලකුණු 3කින් සුදුසු ලකුණක් දීමේ හැකියාවක් ද තිබේ. (ii) කොටසේ දී ඇති පාලි ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට මාධ්‍ය භාෂාවෙන් පිළිතුරු සැපයිය යුතු ය. එහි අනුකොටස් හතරකි. ඒ ඒ කොටසට පිළිවෙලින් ලකුණු 1,1,2,2 වශයෙන් ලකුණු 6ක් හිමි වේ.
මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී පළමු කොටසේ (a),(b) අනුකොටස්වල පහසුතාව 50%ක සීමාව ඉක්මවා තිබූ අතර (c) අනුකොටසේ පහසුතාව 10%කි. දෙවන කොටසේ (a) අනුකොටසේ පහසුතාව 98%ක් වන අතර (c) හා (d) අනුකොටස්වල පහසුතාව පිළිවෙලින් 17%ක් හා 18%ක් වේ.

මෙම ප්‍රශ්නයේ පළමු කොටසට පිළිතුරු සැපයීමේ දී මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවට වාක්‍ය පරිවර්තනය කිරීමේ හැකියාව ලබා තිබිය යුතු ය. මේ සඳහා පාලි භාෂාව තරණය 1 පොත වත් පරිවර්තනය කර තිබීම වැදගත් වනු ඇත. ඒ ඒ විභක්තියට ගැලපෙන අයුරින් පාලි පද ලිවීම සිසුන්ට දුෂ්කර වී තිබේ. නියමානුකූල ව විභක්තිය යෙදීමට අපොහොසත් වීම මෙම ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම දුෂ්කර වීමට හේතුව යි.

දෙවන කොටසේ අනුකොටස්වලට මාධ්‍ය භාෂාවෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය. පාලි භාෂාවෙන් ද පිළිතුරු සපයා තිබිණි. ඒ සඳහා ද ලකුණු ලබා දීමට මණ්ඩලයේ එකඟතාව හිමි විය. (c) හා (d) අනුකොටස්වල සාධනය අඩුවීමට හේතුව ලෙස අදාළ වචනවල තේරුම නොදැනීම දැක්විය හැකිය. මේ සඳහා පාලි භාෂාව 5 පොතේ ඇති ගද්‍ය පද්‍ය කොටස් කියවා අර්ථාවබෝධය ලබා ගත යුතු ය. ගුරුභවතුන් විසින් පදානුපදික ව පරිවර්තනය කර සිසුන් ලවා ද පරිවර්තනය කරවිය යුතු ය. එකී පාඨයන්හි ඇති සුවිශේෂී වචනවල අර්ථ ලිවීමට හුරුව ලබා දිය යුතුය. භාෂාව ප්‍රගුණ කිරීමට ශබ්ද කෝෂ භාවිත කිරීමද වැදගත් වේ. එමගින් දුෂ්කර වචනවලට අර්ථ සපයාගත හැකි ය.

## II කොටස

### 3 ප්‍රශ්නය

3. (I) එකාර, ඔකාර උප්පත්තිස්ථාන දැක්වෙන බාලාවතාර පාඨ ලියන්න. **(ලකුණු 02යි.)**

**ආදර්ශ පිළිතුර**

එකණ්ඨතාලුජො; ඔකණ්ඨොට්ඨජො

(II) පහත සඳහන් පද විසන්ධි කරන්න.

(I) යථාහං
(II) ඉදමබ්‍රවි
(III) ස්වාගතං
(IV) සාසපෙරිව
(V) නහත්ථලා
(VI) සත්තාහං
(VII) තදෙතරා
(VIII) යථාක්කමං **(ලකුණු 04යි.)**

**ආදර්ශ පිළිතුර**

(I) යථා + අහං
(II) ඉදං + අබ්‍රවි
(III) සු + ආගතං
(IV) සාසපෙ + ඉව
(V) නහ + ථලා
(VI) සත්ත + අහං
(VII) තදා + ඉතරා
(VIII) යථා + කමං

(III) පහත සටහන් බාලාවතාර සූත්‍රයන්හි සන්ධි කාර්ය දක්වා නිදසුන් දෙක බැගින් සපයන්න.

(I) වග්ගන්තං වා වග්ගෙ
(II) සරා සරෙ ලොපං
(III) වා පරො අසරූපා
(IV) පරො වා සරො **(ලකුණු 06යි.)**

**(ලකුණු 2 + 4 + 6 =12යි.)**

**ආදර්ශ පිළිතුර**

(I) වග්ගන්තං වා වග්ගෙ - වර්ගාක්ෂරයක් පරවූ කල්හි බින්දුවට එම වර්ගයේ අන්ත අකුර ආදේශ වේ. (වර්ගාන්තාදේශය)
කිං + කතො = කිඞ්කතො
සං + ජාතො = සඤ්ජාතො

(II) සරා සරෙ ලොපං - ස්වරයා පරකල්හි පූර්ව ස්වරය ලොප් වේ. (පූර්වස්වර ලෝපය)
ලොක + අග්ගො = ලොකග්ගො
මාතු + උපට්ඨානං = මාතුපට්ඨානං

(III) වා පරො අසරූපා - අසමාන රූප ඇති ස්වරයා කෙරෙන් පරස්වරය ලොප් වේ. (පරස්වර ලෝපය)

ඡායා + ඉව = ඡායාව


ඉති + අපි = ඉතිපි

(IV) පරො වා සරො - බින්දුවෙන් පර වූ ස්වරය විකල්පයෙන් ලොප් වේ.

බීජං + ඉව = බීජංව


චක්කං + ඉව = චක්කංව

**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරාගත හැකි ප්‍රශ්නයකි. පිළිතුරු සපයා ඇති අපේක්ෂක ප්‍රතිශතය 68.16% කි. මෙම ප්‍රශ්නය සඳහා ද ලකුණු 12ක් හිමි වේ.

ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 60%ක් ද,
ලකුණු 4 - 6 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 7 - 9 ප්‍රාන්තරයේ 7%ක් ද,
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 3%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 3%කි. අපේක්ෂකයන්ගෙන් 60%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නය වර්ණ මාලාවෙන් හා සන්ධි යන පාඩම්වලින් සැකසෙන අතර අනුකොටස් තුනකි. එම කොටස්වලට පිළිවෙලින් ලකුණු 2,4,6 වශයෙන් ලකුණු 12ක් හිමි වේ. පළමු අනුකොටසට සූත්‍ර පාඨ දෙක ලිවීමෙන් එක් පාඨයකට එක් ලකුණ බැගින් ලකුණු 2ක් පිරි නමා ඇත. දෙවන අනුකොටසට සන්ධි පද 8ක් ලබා දී ඒවා විසන්ධි කොට දැක්වීම සිදු කළ යුතු අතර එක් නිවැරදි පිළිතුරකට ලකුණු 1/2 බැගින් ලකුණු 4ක් ද, පිරි නමා ඇත. තෙවන කොටසට බාලාවතාර සූත්‍ර 4ක සන්ධි කාර්ය දක්වා නිදසුන් 2 බැගින් සැපයීමට සිසුන්ට අවස්ථාව දී තිබේ. මෙම ප්‍රශ්නයේ (i),(ii),(iii) කොටස් සඳහා පහසුතාව පිළිවෙලින් 51%, 24%, 20%කි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී වර්ණමාලාව පිළිබඳවත් සන්ධි පිළිබඳවත් අවබෝධයක් ලබා තිබිය යුතු ය. මෙම ප්‍රශ්න පෙළ පොත ඇසුරින් සැකසෙන බැවින් මේ සඳහා මෙකී පාඩම් ආවරණය වී තිබිය යුතු ය. දැනුම හා මතකය ඇසුරින් ම මේ ප්‍රශ්නය සැකසී ඇති නිසා අමතක ව යාමෙන් පිළිතුර වැරදි වීමට පුළුවන. (i) කොටසට තරමක් සාර්ථක ව පිළිතුරු සපයා ඇති අතර (ii) හා (iii) කොටස්වලට පිළිතුරු සැපයීම දුර්වල මට්ටමක පවතී. ඊට හේතුව වන්නේ සන්ධි පිළිබඳ නිවැරදි වැටහීමක් නොතිබීම විය හැකිය. පෙළපොතේ සන්ධි පාඩමේ ඇති සන්ධි පද විසන්ධි කිරීමටත්, විසන්ධි පද සන්ධි කිරීමටත්, සූත්‍ර පැහැදිලි කිරීමටත්, ශිෂ්‍යයින් උනන්දු කරවිය යුතු ය. එකී වචන සහිත නිදසුන් වාක්‍ය ඇසුරින් සන්ධි විසන්ධි කිරීමටත් විසන්ධි සන්ධි කිරීමටත් සිසුන් පෙළඹවිය යුතු ය. මේ සඳහා දෘශ්‍යාධාර භාවිත කිරීම ඉතා වැදගත් ය.

**4 ප්‍රශ්නය**

4. (I) **සම්පදානෙ චතුත්ථී** යන සූත්‍රයට අර්ථ ලියා උදාහරණයක් සපයන්න. **(ලකුණු 02යි.)**

**ආදර්ශ පිළිතුර**

සම්ප්‍රදානාර්ථයේ චතුර්ථී විභක්තිය යෙදේ.

උදාහරණ :- **සංඝස්ස** චීවරං දදාති.

(II) පහත පාඨයන්හි තද කළු අකුරින් මුද්‍රිත නාමපදයන්හි විභක්තිය හා වචනය ලියන්න.

(I) භගවා **සාවත්ථියං** විහරති.

(II) නමො **තස්ස** භගවතො.

(III) සචෙ **මයි** දයා අත්ථි.

(IV) තෙ **භික්ඛුනීනං** උපස්සයං ගච්ඡිංසු. **(ලකුණු 04යි.)**

**ආදර්ශ පිළිතුර**

(I) සත්තමී - ඒකවචන

(II) චතුත්ථී - ඒකවචන

(III) සත්තමී - ඒකවචන

(IV) ඡට්ඨී - බහුවචන

(III) තද කළු අකුරින් මුද්‍රිත පදවල ක්‍රියා විභක්තිය නම් කරන්න.

(I) දෙවො **වස්සතු** කාලෙන.

(II) අහං උපාලිං විනයං **පුච්ඡෙය්‍යං.**

(III) රාහු චන්දං **පමුච්චස්සු.**

(IV) **වන්දෙ** තං බොධිපාදපං.

(V) **භජෙථ** මිත්තෙ කල්‍යාණෙ.

(VI) සබ්බාරි විජයං **අකා.**

(VII) ආවුසො මා **සොචිත්ථ.**

(VIII) කිං **කරිස්සාමි** අරඤ්ඤවාසෙන.

(IX) කුමාරො හීයො ගාමං **ජගාම.**

(X) රාහුලො භගවන්තං **උපසඞ්කමි.**

(XI) **වන්දාමි** චෙතියං සබ්බං.


(XII) සබ්බෙ භද්‍රානි **පස්සන්තු.** **(ලකුණු 06යි.)**

**(ලකුණු 2 + 4+ 6 =12)**

**ආදර්ශ පිළිතුර**

| | | | |
|---|---|---|---|
| (I) | පංචමී | (II) | සත්තමී |
| (III) | පංචමී | (IV) | වත්තමානා |
| (V) | සත්තමී | (VI) | හීයත්තනී / අජ්ජතනී |
| (VII) | අජ්ජතනී/ හීයත්තනි | (VIII) | භවිස්සන්ති |
| (IX) | පරොක්ඛා | (X) | අජ්ජතනී |
| (XI) | වත්තමානා | (XII) | පංචමී |


**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය අනිවාර්ය වූවක් නොවේ. මේ සඳහා අපේක්ෂකයින් 52.63%ක් පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 47%ක් ද,
ලකුණු 4 - 6 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 7 - 9 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 1%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. 4වන ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 1%කි. අපේක්ෂකයන්ගෙන් 47%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් තුනකින් යුක්ත ය. එම කොටස් නාම වරනැගීම හා ආඛ්‍යාත වරනැගීම යන පාඩම් ඇසුරින් සකසා ඇත. (i), (ii) කොටස් නාම වරනැගීම් ඇසුරින් ද (iii) කොටස ආඛ්‍යාත විභත්ති ඇසුරින් ද සැකසී ඇත.

(i) කොටස සඳහා පහසුතාව 47%ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 41%ක් ද, (iii) කොටස සඳහා පහසුතාව 28%ක් ද වේ. මෙම අඩු සාධනය සඳහා අදාළ විෂය නිර්දේශ ආවරණය නොවීම හා විෂය කොටස් මඟහැර ඉගැන්වීම හේතු විය හැකි අතර ශිෂ්‍යයන් නාම විභක්ති හා ආඛ්‍යාත විභක්ති පටලවා ගන්නා ස්වරූපයක් ද නිරීක්ෂණය විය. ක්‍රියා විභක්තිය නම් කිරීමේ දී සාම්ප්‍රදායික ව කටපාඩම් කරගෙන තිබුණත් ව්‍යවහාරයෙන් ප්‍රශ්න සැකසීමේ දී එය ගලපාගෙන තේරුම් ගැනීමට අපහසු වූ බවක් පෙනේ.

**5 ප්‍රශ්නය**

5. (I) ගුණාදිතො වන්තු යන සූත්‍රයෙහි අර්ථ ලියා උදාහරණ දෙකක් සපයන්න. **(ලකුණු 02යි.)**

**ආදර්ශ පිළිතුර**

ගුණාදි අකාරාන්ත ශබ්දවලින් පරව 'එය ඔහුට ඇත්තේය' යන අර්ථයෙහි 'වන්තු' ප්‍රත්‍යය යෙදේ.
උදාහරණ :- ගුණවන්තු , සීලවන්තු

(II) පහත තද්ධිත පදවල අර්ථය ලියන්න.

(I) භාගිණෙයෙයා
(II) අරහත්තං
(III) මෙධාවී
(IV) සත්තධා **(ලකුණු 04යි.)**

**ආදර්ශ පිළිතුර**

(I) භාගිණෙයෙයා - බෑණා
(II) අරහත්තං - රහත් බව
(III) මෙධාවී - නුවණ ඇති/නුවණැත්තා
(IV) සත්තධා - සත් කඩකට

(III) පහත සඳහන් සමාස පද නම් කරන්න.


(I) ජිනචරිතං
(II) බහිනගරං
(III) ඛීණාසවො
(IV) නාමරූපං
(V) අසුරො
(VI) චතුද්දිසං **(ලකුණු 06යි.)**

**(ලකුණු 2 + 4 + 6 =12යි.)**

**ආදර්ශ පිළිතුර**

(I) ජිනචරිතං - තප්පුරිස
(II) බහිනගරං - අව්‍යයීභාව
(III) ඛීණාසවො - බහුබ්බීහි
(IV) නාමරූපං - ද්වන්ද
(V) අසුරො - කම්මධාරය
(VI) චතුද්දිසං - දිගු


**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය ද තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයකි. පිළිතුරු සපයා ඇති අපේක්ෂක ප්‍රතිශතය 28.95%ක් වේ. මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ.

ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 45%ක් ද,
ලකුණු 4 - 6 ප්‍රාන්තරයේ 43%ක් ද,
ලකුණු 7 - 9 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 2%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 2%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 45%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය සමාස හා තද්ධිත ඇසුරින් අසනු ලබන ප්‍රශ්නයකි. මෙහි ද කොටස් තුනකි. (i),(ii) කොටස් තද්ධිත පිළිබඳ විමසීමටද (iii) කොටස සමාස පිළිබඳ විමසීමට ද යොදාගෙන තිබේ. ඒ ඒ කොටස්වලට පිළිවෙලින් ලකුණු 2,4,6 වශයෙන් හිමි වේ.

(i) කොටස සඳහා පහසුතාව 29%ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 24%ක් ද, (iii) කොටස සඳහා පහසුතාව 32%ක් ද වේ. විෂය නිර්දේශ ආවරණය නොවීම විශේෂ කරුණක් ලෙස දැක්විය හැකි අතර (ii) කොටසට පිළිතුරු සැපයීමේ දී වචනවල අර්ථ අමතක ව යාම හෝ නොදැනීම අඩු සාධනය පෙන්වීමට හේතුව විය හැකිය. (i) කොටසේ සූත්‍ර පාඨය පිළිබඳ පැහැදිලි වැටහීමක් තිබූ බවක් පෙනෙන්නට නොතිබිණි. (iii) කොටසේ දී තරමක් සාර්ථක වූ අතර සමාස පාඩමක් ලෙස උගන්වන්නක් එසේ සාර්ථක වී ඇති බව සිතිය හැකිය. පෙළ පොතේ නිවැරදි පාඩම්, සූත්‍ර පාඨ අර්ථය හා පරිවර්තන සහිත ව ඉගැන්වීම වැදගත් වේ. එහි ඇති සූත්‍ර පාඨයන්හි අර්ථ හා ඒවාට නිදසුන් ද මතකයේ තබා ගැනීම සිසුන්ට පැවරෙන වගකීමකි.

**06 ප්‍රශ්නය**

6. (I) පහත සංඛ්‍යා පාලියෙන් ලියන්න.
(I) 84 (II) 99 **(ලකුණු 02යි.)**

**ආදර්ශ පිළිතුර**

(I) 84 - චතුරාසීති/චතු අසීති
(III) 99 - එකූනසතං

(II) පහත වාක්‍යය කර්ම කාරකයට හරවන්න.
(I) අහං රුක්ඛං ඡින්දාමි.
(II) බුද්ධො ධම්මං දෙසෙති.
(III) සීහො මිගෙ මාරෙති.
(IV) දාසො වත්‍ථං ධොවති. **(ලකුණු 04යි.)**

**ආදර්ශ පිළිතුර**


(I) අහං රුක්ඛං ඡින්දාමි - මයා රුක්ඛො ඡිජ්ජීයති /ඡිජ්ජීයතෙ
(II) බුද්ධො ධම්මං දෙසෙති - බුද්ධෙන ධම්මො දෙසීයති /දෙසීයතෙ
(III) සීහො මිගෙ මාරෙති - සීහෙන මිගා මාරීයන්ති /මාරීයන්තෙ
(IV) දාසො වත්‍ථං ධොවති - දාසෙන වත්‍ථං ධොවීයති/ධොවීයතෙ

(III) පහත දැක්වෙන මාතෘකා අතුරෙන් එකක් තෝරාගෙන වාක්‍යය හයකට නො අඩු පාලි රචනාවක් ලියන්න.
(I) සීහො මිගරාජා
(II) අම්හාකං පරිවෙණං
(III) අනුරාධපුරං **(ලකුණු 06යි.)**
**(ලකුණු 2 + 4 + 6 =12)**

**ආදර්ශ පිළිතුර**

මාතෘකාවට අදාළ ලෙස නිවැරදි වාක්‍ය 6ක් අවම වශයෙන් ලියා තිබිය යුතු ය. එක් වාක්‍යයකට එක ලකුණ බැගින් පිරිනමන්න. ව්‍යාකරණ දෝෂ සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.


**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය ද තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයකි. පිළිතුරු සපයා ඇති අපේක්ෂක සංඛ්‍යාව 56.32% ක් වේ. මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 54%ක් ද,
ලකුණු 4 - 6 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 7 - 9 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 0%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

4වන ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් කිසිදු අපේක්ෂකයෙකු නොමැති අතර අපේක්ෂකයන්ගෙන් 54%ක් ම ලකුණු 03ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් තුනකින් යුක්ත වන අතර සංඛ්‍යා පිළිබඳ අවබෝධයත්, කර්මකාරක පිළිබඳ අවබෝධයත් මැන බැලේ. (i) කොටස සංඛ්‍යා අවබෝධයටත්, (ii) කොටස කර්මකාරකයට හැරවීමටත් (iii) කොටස වාක්‍ය රචනයටත් වෙන් කර තිබේ.

(i) කොටස සඳහා පහසුතාව 36%ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 10%ක් ද, (iii) කොටස සඳහා පහසුතාව 39%ක් ද වේ. (iii) කොටසේ වාක්‍ය රචනය තරමක් හෝ සාර්ථක වී ඇති අතර කර්මකාරකයට හැරවීම ඉතාම දුර්වල මට්ටමකින් පැවති බව නිරීක්ෂණය විය. සංඛ්‍යා පාලියෙන් ලිවීම ද ඇත්තේ තරමක් දුර්වල මට්ටමක ය.

විෂය නිර්දේශ ආවරණය කිරීම හා පෙළ පොතේ සෑම අංශයකටම අවධානය යොමු කිරීම වැදගත් වේ. පාඩම් මඟ හැර ඉගැන්වීම, නොසලකා හැරීම නොකළ යුතු ය. සංඛ්‍යා ඉලක්කමෙනුත් පාලි වචනයෙනුත් ලිවීමට පුරුදු කරවිය යුතු ය. වාක්‍ය කර්ම කාරකයට හැරවීමට අදාළ පෙළපොතේ පාඩම ආවරණය කළ යුතු ය. සාමාන්‍යයෙන් සරල මාතෘකාවලට නිතර නිතර වාක්‍ය පහකට නොඅඩු රචනා ලිවිය යුතු ය. මතකයේ තබා ගත යුතු කරුණු වාචෝද්ගත කරවිය යුතු ය.

**07 ප්‍රශ්නය**

(I) පහත දැක්වෙන නිපාත පදවල අර්ථය ලියන්න.

(I) සමන්තා
(II) වත
(III) සුවෙ
(IV) අභිණ්හං **(ලකුණු 02යි.)**

**ආදර්ශ පිළිතුර**

(I) සමන්තා - හාත්පස
(II) වත - ඒකාන්තයෙන්
(III) සුවෙ - හෙට
(IV) අභිණ්හං - නිතර

(II) පහත වාක්‍ය යුගල තුමන්ත ක්‍රියා යොදා තනි වාක්‍යය සේ ලියන්න.

(I) සාමණෙරො පරිවෙණං ගච්ඡති / සො තත්‍ථ පාලිභාසං උග්ගණ්හාති.
(II) ථෙරා පිණ්ඩාය චරන්ති / තෙ ගාමං පවිසන්ති.
(III) අහං විහාරං ගච්ඡාමි / අහං බුද්ධං වන්දාමි.
(IV) පුරිසො පාතොව නගරං ගච්ඡති / සො නගරෙ කම්මං කරොති. **(ලකුණු 04යි.)**

**ආදර්ශ පිළිතුර**

(I) සාමණෙරො පාලි භාසං උග්ගණ්හිතුං පරිවෙණං ගච්ඡති.
(II) ථෙරා පිණ්ඩාය චරිතුං ගාමං පවිසන්ති.
(III) අහං බුද්ධං වන්දිතුං විහාරං ගච්ඡාමි.
(IV) පුරිසො පාතොව කම්මං කාතුං නගරං ගච්ඡති.

(III) පහත සඳහන් බාලාවතාර සූත්‍ර සුදුසු පද යොදා සම්පූර්ණ කරන්න.


(I) නාමානං සමාසො ----------------------
(II) ද්විපදෙ --------------- කම්මධාරයො
(III) නාමානං ---------------ද්වන්දො
(IV) ණ්‍යත්තතා ---------------------
(V) අතීතෙ --------- තාවී
VI) උපසග්ගනිපාතපුබ්බකො ------------ **(ලකුණු 06යි.)**

**(ලකුණු 2 + 4 + 6 =12යි)**

**ආදර්ශ පිළිතුර**

(I) නාමානං සමාසො **යුත්තත්ථො**
(II) ද්විපදෙ **තුල්‍යාධිකරණෙ** කම්මධාරයො
(III) නාමානං **සමුච්චයො** ද්වන්දො
(IV) ණ්‍යත්තතා **භාවෙතු**
(V) අතීතෙ ත **තවන්තු** තාවී
(VI) උපසග්ගනිපාතපුබ්බකො **අබ්‍යයීභාවො**


**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය ද තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයක් වන අතර පිළිතුරු සපයා ඇති අපේක්ෂක සංඛ්‍යාව 46.84% ක් වේ. මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 56%ක් ද,
ලකුණු 4 - 6 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 7 - 9 ප්‍රාන්තරයේ 12%ක් ද,
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 3%ක් ද,
වශයෙන් අපේක්ෂකයින් ලකුණු ලබාගෙන ඇත.

7වන ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 3%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 56%ක් ලකුණු 03ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය ද (i), (ii),(iii) වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත ය. නිපාත පද, තුමන්ත ක්‍රියා හා හිස්තැන් පිරවීම යන විෂය කරුණු මෙමගින් මැන බැලේ. මෙම කොටස්වලට පිළිවෙලින් 2,4,6 වශයෙන් ලකුණු 12ක් පිරිනැමේ.

(i) කොටස සඳහා පහසුතාව 58%ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 23%ක් ද, (iii) කොටස සඳහා පහසුතාව 29%ක් ද වේ. තුමන්ත ක්‍රියා සහිත (ii) කොටසට ලකුණු ලබා ගැනීම ඉතා දුර්වල මට්ටමක පවතී. හිස්තැන් පිරවීම පිළිබඳ වුව ද දුර්වලතා දක්වා තිබේ. (ii) කොටසේ තුමන්ත ක්‍රියා වචන වශයෙන් උගෙන වාක්‍ය තුළ යොදා ලිවීමේ දුර්වලතා දැකිය හැකිය. එබැවින් ගුරුභවතුන් විසින් වාක්‍ය සම්බන්ධ කිරීමට තුමන්ත ක්‍රියා යොදා ගන්නා ආකාරය පැහැදිලි කළ යුතු ය.

(iii) කොටසට පිළිතුරු සැපයීමේ දී දක්වා ඇති දුර්වලතා වන්නේ අදාල විග්‍රහ වාක්‍යයන් මතකයෙන් ලියා දැක්වීමට නොහැකි වීමයි. එබැවින් නියමිත පාඩම්වල ඇති විග්‍රහ වාක්‍ය ගාථ, පාඨ වාචෝද්ගත කර තිබිය යුතු ය. ගුරුභවතුන් ගුරු අත්පොත භාවිත කිරීම වැදගත් වේ. ඒ ඒ පාඩම්වලට අදාළ උපදෙස් වෙන වෙනම ඒවායේ ඇතුළත් කොට තිබේ.

**08 ප්‍රශ්නය**

8. (I) උදානපාළියේ වර්ග පිළිබඳ හැඳින්වීමක් කරන්න. **(ලකුණු 04යි.)**

**ආදර්ශ පිළිතුර**

(I) උදානපාළිය වර්ග 8කින් හා සූත්‍ර 82කින් යුක්ත ය. උදානපාළියෙහි උදාන 82ක් ඇති බව කියන නමුදු උදානපාළියෙහි ඇත්තේ සූත්‍ර අසූවක් පමණි. ඒ ඒ වර්ග හඳුන්වා ඇත්තේ ප්‍රථම සූත්‍රයේ නාමයෙන් හෝ වැදගත්කමින් උසස් ම සූත්‍රයේ හෝ නමිනි.

ප්‍රථම **බෝධිවර්ගයෙහි** ප්‍රථම බුද්ධත්‍වය සමයෙහි කරුණු විස්තර වේ. බුදුන් වහන්සේ පටිච්චසමුප්පාදය මෙනෙහි කිරීමාදි පුවත් මෙහි ඇතුළත් ය. අවසාන සූත්‍රය දාරුචීරිය කථාපුවත විස්තර වේ. බ්‍රාහ්මණ ධර්ම පිළිබඳ ව උදානයන්ගෙන් විස්තර වෙයි. **මුචලින්දවර්ගයේ** ඇතුළත් සිද්ධි අතර, බුද්ධත්‍වයෙන් පසු අකාල මේඝයක් පැමිණි විට මුචලින්ද නාරජු බුදුරදුන්ට ආරක්ෂාව සැලසූ අයුරු සඳහන් සිද්ධිය විස්තර වේ. කොසොල් රජු හා මගධ රජු අතර වූ සාකච්ඡාව රාජ සූත්‍රයේ එයි. බුදුසසුන පිහිටුවීමෙන් පසු අන්‍ය තීර්ථකයන් ලාභ සත්කාරවලින් පිරිහීම පිළිබඳ සත්කාර සූත්‍රයේ එයි. එක්තරා පිරිවැජියෙකු ගර්භිණී වූ බිරිය සඳහා රජු වෙතින් ගිතෙල් ලබා ගැනීමට ගොස් සිදුවූ සිද්ධියක් ගබ්භිනී සූත්‍රයේ ඇතුළත් ය. මහණකමෙහි සැප, රජ සැපවල ද නැතිබව භද්දිය සූත්‍රයේ දක්වේ. **නන්දවර්ගයේ** දෙවන නන්ද සූත්‍රය බුදුරදුන්ගේ සහෝදර වූ නන්ද තෙරුන් මුල දී මහණකමෙහි නො ඇලී සිටි අයුරුත්, පසු ව බුදුරජ එය දුරු කළ සැටිත් විස්තර වේ. යසෝජ සූත්‍රයේ යසෝජ තෙරුන් ප්‍රමුඛ 500ක් රහතුන් ගැන කියවේ. මෙහි කියවෙන උදානයන්ගෙන් භික්ෂුවකගේ ගුණාංග විස්තර වේ. සිවුවන **මේඝියවර්ගයේ** බුද්ධොපස්ථායක මේඝිය තෙරුන් භාවනාවකට ගොස් නැවත පැමිණීමේ සිද්ධියක් විස්තර වේ. ජුණ්හ සූත්‍රයේ සැරියුත් තෙරුන්ට ටොක්කක් ඇණ යක්ෂයකු පණපිටින් අපායගාමී වීම විස්තර වේ. නාග සූත්‍රයෙහි බුදුරදුන් පාරිලෙය්‍ය වනයට වැඩමවීමේ සිද්ධිය දක්වේ. මෙම වර්ගයේ උදානගාථාවල සිත ගැන විස්තර වන ධර්ම කරුණු ඇතුළත් ය. පස්වන **සෝණවර්ග යේ** මුගලන් තෙරුන් දුස්සීල භික්ෂුවක උපෝසථාගාරයෙන් නෙරපා දැමූ පුවතක් උපෝසථ සූත්‍රයෙහි අඩංගු ය. හයවන සූත්‍රයේ සෝණකුටිකණ්ණ තෙරුන්ගේ කථාව ඇතුළත් වෙයි. මෙහි එන උදානගාථාවලින් ආර්ය ශ්‍රාවකයන්ගේ චිත්ත-චෛතසික ධර්මයන් පිළිබඳ ව තොරතුරු විස්තර වේ. **ජච්චන්ධවර්ගයේ** පළමු සූත්‍රයෙන් බුදුරදුන් චාපාල චෛත්‍යස්ථානයේ දී ආයුසංස්කාර අත්හැරීමේ පුවත විස්තර කෙරේ. 4වන සූත්‍ර ජාත්‍යන්ධයන් අලියෙකුගේ රුව කියූ සැටි දක්වෙන උපමා කථාවකින් යුක්ත ය. එහි එන "ජච්චන්ධ" යන වචනය මෙම වර්ගය නම් කිරීමට ද මුල් විය. අන්‍ය ලබ්ධික තීර්ථකයන්ගේ දර්ශනයන් බොහෝ උදාන ගාථාවලින් විවරණය වේ. හත්වන **චූලවර්ගය** කුඩා සූත්‍ර 100කින් යුක්ත ය. 9වන සූත්‍ර උදපාන සූත්‍රයයි. බුදුරදුන් මල්ලරට ථූප නම් බමුණුගමට පැමිණි විට උන්වහන්සේට පැන් නො ලැබෙන සේ තණකොළ දමා ළිං වැසූ සැටි දක්වේ. 10වන සූත්‍රයේ උදේන රජුගේ මෙහෙසිය වූ සාමාවතියගේ මරණය ගැන සඳහන් ය. උදානගාථාවලින් පාපකර්ම, ක්ලේශ ධර්ම පිළිබඳ විස්තර වේ. අටවන **පාටලීගාමියවර්ගය** බුදුරදුන්ගේ අන්තිම දානය පිළිගැනීම, නාගසමාල තෙර බුදුන්ගේ පාත්‍රය බිමදමා අන්‍ය තීර්ථකයන් වෙත යාම ආදි පුවත් විස්තර වන්නකි. මෙහි නිර්වාණය පිළිබඳ ඇතුළත් උදානගාථාවන්ගෙන් යුක්ත ය. මෙසේ උදානපාළිය බුද්ධශාසනයේ ඓතිහාසික සිද්ධි සමූහයක් විස්තර වන ග්‍රන්ථයක් ලෙස හඳුනාගත හැකි ය.

(II) පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියන්ගෙන් පාලි සාහිත්‍යයට වූ සේවාව අගයන්න.

**(ලකුණු 04යි.)**

**ආදර්ශ පිළිතුර**

- පාලි භාෂාධ්‍යයනයට උපකාර පිණිස වන පාලි භාෂාවතරණය ආදි ග්‍රන්ථ රාශියක් ලිවීම.
- බුරුම වැසියන්ගේ පාලි භාෂාධ්‍යයනයට උපකාරී වන පාලිභාසප්පවෙසනී ආදි ග්‍රන්ථ රචනා කර තිබීම.
- පාලි ඉගෙනීමට අවශ්‍ය ග්‍රන්ථ ඉංග්‍රීසි බසින් ලියා තිබීම.
- ථෙරවාද බෞද්ධ දර්ශනය ආදි පාලි සාහිත්‍යයේ හරධර්ම ඇතුළත් කෘති රාශියක් ලියා තිබීම.
- එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගමේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වීම.
- අග්ගමහා පණ්ඩිත යන උපාධියෙන් පුද ලද ප්‍රථම ලාංකික භික්ෂුව වීම යනාදි කරුණු විස්තර වී තිබිය යුතු ය.


(III) මහාප්‍රජාපතී ගෝතමිය පරිනිර්වාණ අවස්ථාවෙහි දැක් වූ පෙළහර පිළිබඳ විස්තර කරන්න.

**(ලකුණු 04යි.)**
**(4 + 4 + 4 = 12යි)**

**ආදර්ශ පිළිතුර**

එක ම තැනැත්තිය බොහෝ ආකාර වූවා ය, බොහෝ අය ද එකක්ව වූවා ය,
පවුර හරහා ද පර්වතය හරහා ද නොගැවෙමින් ගියා ය,
පොළොවෙහි ද ගැලුණාය, පොළොවෙහි මෙන් නො බිඳෙමින් ජලයේ ගියාය.
කිරිල්ලියක මෙන් අහසෙහි පළඟින් යුතුව ගියා ය,
බඹලොව දක්වා කයින්, වසඟයෙහි පැවැත්වූවා ය.
මහාමේරු පර්වතය කුඩම්ටක් කොට මහපොළොව කුඩයක් කොට සහමුලින් ම පෙරළා දරමින් අහසෙහි හැසිරුණා ය.
හිරු 6ක් උදාවන කාලයක මෙන් ලොව ද දුම් ඇති කළාය,
ලෝකය කල්පාන්තයේ මෙන් ගිනිදැල්වලින් ගැවසීගත්තක් කළා ය.
මුචලින්ද මහාපර්වතය මේරු මන්දාර දද්දර පර්වත සියල්ල අබඇට මෙන් එකමිටට ගත්තී ය.
හඳ සහිතව හිරු ඇඟිලිතුඩින් වැසුවා ය,
දහස් ගණනක් සඳහිරු මුදුන්මල්කඩ සෙයින් දැරුවා ය.
සිවු සයුරෙහි දිය එකඅල්ලෙන් දැරුවා ය,
යුගාන්තයෙහි මහා මේඝයක් බඳු මහවැසි වැස්ස වූවා ය.
අහස් තලයෙහි පිරිස් සහිත සක්විතිරජකු මැව්වා ය,
ගුරුළෙකු, ඇතෙකු, නාද කරන සිංහයෙකු දැක්වූවා ය.
අප්‍රමාණ භික්ෂුණී සමූහයා මවා නැවත අතුරුදහන් කළා ය.


**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය ද තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයක් වන අතර පිළිතුරු සපයා ඇති අපේක්ෂක සංඛ්‍යාව 34.74%ක් වේ. මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 4 - 6 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 7 - 9 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 13%ක් ද,
වශයෙන් ලකුණු ලබාගෙන ඇත.


8වන ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 13%කි. අපේක්ෂකයන් අතුරෙන් 35%ක්ම ලකුණු 03ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ ද කොටස් තුනක් ඇති අතර පාලි සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ අවධානය යොමු කෙරේ. මේ සඳහා කොටසකට ලකුණු 4 බැගින් කොටස් 3ට ලකුණු 12ක් හිමි වේ.

(i) කොටස සඳහා පහසුතාව 46%ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 46%ක් ද, (iii) කොටස සඳහා පහසුතාව 31%ක් ද වේ. සිසුන්ට වැඩි වශයෙන් පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්නයක් ලෙස දැක්විය හැකිය. ගුරුභවතුන් විසින් සිසුන්ට ඒ ඒ විෂය කරුණු වෙන් වෙන් වශයෙන් මතුකර දිය යුතු ය. ඒ ඒ කරුණු පිළිබඳ විස්තර ලිවීමට සිසුන් දැනුවත් කළ යුතු ය. නිර්දිෂ්ට කෘති, කතුවරු පිළිබඳ තොරතුරු කියවීම ඉතා වැදගත් වනු ඇත.

### 2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනාඃ




1 වන හා 2 වන ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වන අතර 1වන ප්‍රශ්නයට අපේක්ෂකයින් 97.63%ක් පිළිතුරු සපයා ඇත. එම ප්‍රශ්නයේ පහසුතාවය 50.61%කි. 2වන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් ප්‍රතිශතය 96.05%ක් වන අතර එහි පහසුතාවය 45.25%කි. අඩුම අපේක්ෂකයින් පිරිසක් එනම් 28.95%ක් තෝරාගෙන ඇත්තේ 5වන ප්‍රශ්නයවන අතර එහි පහසුතාවය 28.57%කි. 5 වන ප්‍රශ්නයට අමතර ව 30%ට වඩා අඩු පහසුතාවයක් 6වන ප්‍රශ්නයට ද පෙන්නුම් කර ඇති අතර එහි පහසුතාවය 28.43%කි.

සන්ධි හා තද්ධිත පිළිබඳ දැනුම 5වන ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇති අතර 6වන ප්‍රශ්නයෙන් සංඛ්‍යා පිළිබඳ අවබෝධය හා කර්ම කාරක පිළිබඳ අවබෝධය පරීක්ෂා කර ඇත. මෙම කොටස් සඳහා සිසුන්ගේ අවබෝධය වර්ධනය කිරීමට පෙළ පොත පරිශීලනය, පසුගිය ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීමේ හුරුව ලබා දීම මෙන්ම මතකයේ තබාගත යුතු කරුණු ක්‍රියාකාරකම් පාදක ව වාචෝද්ගත කරවීම සිදු කළ හැකිය.

තෝරාගත යුතු ප්‍රශ්න අතුරෙන් වැඩිම අපේක්ෂකයන් ප්‍රතිශතයක් 3වන ප්‍රශ්නය තෝරා ගෙන ඇති අතර එහි ප්‍රතිශතය 68.16%කි. එම ප්‍රශ්නයේ පහසුතාවය 31.15%කි. වර්ණමාලාව සහ සන්ධි පිළිබඳ අවබෝධය පරීක්ෂා කර ඇති මෙම ප්‍රශ්නය කොටස් 3ක් ලෙස ලබා දී ඇත.එහි සූත්‍ර පාඨ ලිවීමට ලබා දී ඇති (i) කොටසේ පහසුතාව 51%කි.

## III කොටස

## 3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

**පොදු උපදෙස්**

- ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතු ය. අනිවාර්ය ප්‍රශ්න හා තෝරාගත් ප්‍රශ්න වශයෙන් ද කොටස් හා අනුකොටස් වශයෙන් ද ප්‍රශ්න පත්‍රයට ගත වන කාලය පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.
- I පත්‍රයට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන පැහැදිලි එක් කතිර ලකුණක් (X) පමණක් යෙදිය යුතු ය.
- II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී තෝරා ගන්නා ප්‍රශ්න අතරින් පහසු ප්‍රශ්න තෝරා ගත යුතු ය.
- II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
- ප්‍රශ්න අනුකොටස් පිළිවෙලට යෙදීම වැදගත් වේ.
- නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් සැපයිය යුතු ය.
- සෑම පිටුවකම අපේක්ෂකයාගේ විභාග අංකය හා පිටු අංකය යෙදිය යුතු ය.
- කෙටි පිළිතුරු කෙටි වශයෙන් ද දීර්ඝ පිළිතුරු දීර්ඝ වශයෙන් ද ලිවිය යුතු ය.
- පිළිතුරු සැපයීමේ දී එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරාගත යුතු ය.
- පිළිතුරුපත් ඇමිණීමේ දී පිටු අංක පිළිවෙලට ඇමිණිය යුතු ය.
- මුල් පිටුවේ විභාග අංකය විෂය හා පත්‍රය ආදී සඳහන් කළ යුතු විස්තර අනිවාර්යයෙන් ම ඇතුළත් කළ යුතු ය.
- II පත්‍රයේ ප්‍රශ්නවලින් නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට පමණක් පිළිතුරු සැපයීමට කාලය මිඩංගු කළ යුතු අතර, වැඩිපුර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට කාලය වැය නොකළ යුතු ය.

### 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

- ⋆ අත් අකුරු නිවැරදි ව හා නිරවුල් ව ලිවීමට ශිෂ්‍යයා යොමු කළ යුතු ය. අත් අකුරු ලිවීමේ අභ්‍යාසවල ශිෂ්‍යයා යෙදවිය යුතු ය.
- ⋆ අක්ෂර හා අක්ෂර ප්‍රභේද, උත්පත්තිස්ථාන ආදිය විග්‍රහ වාක්‍ය ඇසුරින් ඉගැන්වීම කළ යුතු ය. පාඨ වාචෝද්ගත කළ යුතු ය. පාඨවල අදහස මාධ්‍ය භාෂාවෙන් ලිවිය යුතු ය.
- ⋆ නිර්දිෂ්ට සූත්‍ර හා ගාථාවලට අර්ථ ලිවීමට අර්ථ පාඩම් කරවිය යුතු ය. තෝරාගත් ඡේදවලට හා ගාථාවලට අර්ථ ලියවා නිවැරදි කර විය යුතු ය. නිර්දිශ්ඨ පාඨ හා ගාථාවල අර්ථ පැහැදිලි කර දිය යුතු ය.
- ⋆ ගාථාවලට අර්ථ සැපයීමේ දී අන්වය සකසා ගන්නා ආකාරය පෙන්වා දිය යුතු ය.
- ⋆ නියමිත පාලි පාඨ ග්‍රන්ථයේ ඇති ඡේද හා ගාථා අර්ථ ගන්වා තේරුම් කර දිය යුතු ය. ඒ ඇසුරින් ප්‍රශ්න සකසා ඒවාට පිළිතුරු සැපයීමට සිසුන් යොමු කළ යුතු ය.
- ⋆ ප්‍රශ්න පත්‍රයේ ඇති නිවැරදි නොවන පිළිතුරුවලට ගැලපෙන ප්‍රශ්න සිසුන් ලවා සකස් කරවිය යුතු ය.
- ⋆ සරල මාතෘකා කිහිපයකට රචනා ලියවා එසේ රචනා ලිවීමට සිසුන් යොමු කළ යුතු ය.
- ⋆ ප්‍රශ්න පත්‍රයේ ස්වරූපය පැහැදිලි කර දී පහසු ප්‍රශ්න තෝරාගන්නා ආකාරය පෙන්වා දිය යුතු ය. අනිවාර්ය ප්‍රශ්න මඟ හැරිය යුතු නොවන බව අවධාරණය කළ යුතු ය.
- ⋆ ලේඛන දුර්වලතා මඟහරවා ගැනීමට සතතාභ්‍යාසයේ යෙදිය යුතු ය.
- ⋆ ව්‍යාකරණ, ඉගැන්වීමේ දී සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා නූතන ව්‍යවහාර ක්‍රමයක් සකසා ගත යුතු ය.
- ⋆ ව්‍යාකරණ හුදකලාව නූගන්වා ව්‍යවහාරයේ වාක්‍යවල එන ව්‍යාකරණ තුළින් ව්‍යාකරණ ඉගැන්විය යුතු ය.
- ⋆ විටින් විට ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියවා ශිෂ්‍යයා ප්‍රබෝධමත් කළ යුතු ය.
- ⋆ කටපාඩම් කරගත යුතු දේ වෙන් කොට ලබා දී ටිකෙන් ටික පාඩම් ගත යුතු ය.
- ⋆ නිර්දිෂ්ට ග්‍රන්ථ හා කතුවරු පිළිබඳ තොරතුරු එක්රැස් කරවිය යුතු ය.
- ⋆ ප්‍රතිඵල විශ්ලේෂණ වාර්තා සසඳා බලා සිසුන්ගේ දුර්වල අවස්ථා මොනවාදැයි තේරුම් ගෙන කටයුතු කළ යුතු ය.
- ⋆ පාලියේ දෛනික ව්‍යවහාර ඇසුරින් සංවාදයේ යෙදිය යුතු ය.

ඉහත කී කරුණු අනුගමනය කිරීමෙන් පාලි විෂය උසස් ලෙස සමත් කර ගැනීමට හැකිවනු ඇත.